# කාර්යසාධන වාර්තාව

# 2012

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# දැක්ම

## ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

# මෙහෙවර

## රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ඨ පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල පාලනය ශක්තිමත් කිරීම

## පටුන

1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යයසාධනය 1

1.1 සමාලෝචනය 1

1.1.1 2012 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් සහභාගී වූ කෝප් රැස්වීම් 2

1.2 කාර්යය සාධනය 3

1.2.1 ලාභාංශ 3

1.2.2 සේවා නියුක්තිය 5

1.2.3 රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා දීම 5

2. රාජ්‍ය ව්‍යාපාරයන්හි සමාලෝචනය 5

2.1 සමාලෝචනය 5

2.2 බලශක්ති 7

2.3 ජලය 8

2.4 වරාය 10

2.5 මගී ප්‍රවාහනය 11

2.6 ගුවන් සේවා 12

2.7 ඉදිකිරීම් අංශය 13

2.8 රාජ්‍ය බැංකු 14

2.9 රක්ෂණය 15

2.10 ලොතරැයි 16

2.11 පශු සම්පත 16

2.12 වැවිලි අංශය 17

2.13 සෞඛ්‍ය 19

2.14 මාධ්‍ය 19

2.15 අලෙවිය හා බෙදාහැරීම 20

2.16 පුනර්ජනනීය නොවන සම්පත් 20

2.17 රජය සතු ව්‍යාපාර වල ලාභදායීත්වය 21

2.18 ප්‍රතිව්‍යුහගත වෙමින් පවතින ව්‍යාපාර 23

2.19 වාර්ෂික වාර්තා භාරදීම - රජය සතු වාණිජ ව්‍යාපාර 25

3. මානව සම්පත් කළමණාකරණය 27

4. මූල්‍ය කළමනාකරණය 30

# 1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යයසාධනය

## 1.1 සමාලෝචනය

ශ්‍රී ලංකා රජය සතු ව්‍යවසායයන්ගේ යහපාලනය සහතික කිරීම තුළින් මහින්ද චින්තන ඉදිරි දැක්මේ සංවර්ධන ඉලක්කයන් ළඟා කරගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර මෙහෙයවීමේ ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කරයි. වරාය, ගුවන්සේවා, ජලය, විදුලිය, බලශක්ති, බැංකු හා රක්ෂණය ආදී වූ රජයට අයත් වාණිජ ව්‍යාපාරයන් ජාතික ආර්ථිකයේ උපායමාර්ගිකව වැදගත් භූමිකාවක් නිරූපනය කරයි. 2005 වසරේ සිට ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය නොකිරීමේ ප්‍රතිපත්තිය මත මෑත කාලයේ එම රාජ්‍ය ව්‍යාපාර සාපේක්ෂකව ඉහළ වැදගත්කමක් ලබාගෙන ඇත. රාජ්‍ය ව්‍යාපාරවල අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ඒවායේ සම්පත් කාර්යක්ෂම හා ඵලදායී උපයෝජනය මෙන්ම යහපාලනය සඳහා වූ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. තවද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය විනය තහවුරු කිරීම සඳහා ඒවායේ මෙහෙයුම් හා මූල්‍ය කළමනාකාරිත්වය පිළිබඳව මාර්ගෝපදේශ හඳුන්වාදීමත් සිදුකරනු ලබයි.

එසේම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ ලංකා බැංකුව, මහජන බැංකුව, විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වරාය අධිකාරිය වැනි ආයතන සාමූහික ගිවිසුම් තුළින් මානව සම්පත වැඩිදියුණු කරගැනීමට කටයුතුකර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ගේ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීමට අදාළ චක්‍රලේඛනයක් නිකුත් කිරීමත් ණය හා ප්‍රදාන ඇතුළුව රාජ්‍ය ව්‍යාපාර සඳහා අයවැය ප්‍රතිපාදන ලබාදීමත් සහ විදේශීය ණය ලබා ගැනීමට රාජ්‍ය ඇපකර ලබාදීමත් වශයෙන් රාජ්‍ය ව්‍යාපාරවලට පහසුකම් සලසා ඇත.

2012 වසර තුළදී දෙපාර්තමේන්තු නිළධාරීන් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව වෙත එම ව්‍යවසායන් පිළිබඳව ඇති විගණන විමසුම් පිළිබඳව අවධානය යොමු කරමින් ප්‍රගතිය පිළිබඳව වාර්තා ඉදිරිපත් කර රැස්වීම් 41 සම්බන්ධවී ඇත. ව්‍යාපාර පිළිබඳව පාර්ලිමේන්තු පොදු කාරක සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පුළුල් අධීක්ෂණය හේතුවෙන් රාජ්‍ය ව්‍යාපාරයන්ගේ යහපාලනයේ ප්‍රගතියක් හා වාණිජ වෙළඳකරණය වෙත යොමු වීමක් සිදු වෙමින් පවතී.

### 1.1.1 2012 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් සහභාගී වූ කෝප් රැස්වීම්

| අංක | ආයතනයේ නම | පැවැත්වූ දිනය | සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 23.02.2012 | √ |
| 2 | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය | 24.05.2012 | අවලංගු කරන ලදී |
| 3 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 09.05.2012 | √ |
| 4 | ශ්‍රී ලංකා මහ බැංකුව | 06.07.2012 | √ |
| 5 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 21.06.2012 | √ |
| 6 | ව්‍යාපාර කළමණාකාරිත්වය පිළිබඳව ජාතික ආයතනය | 16.08.2012 | √ |
| 7 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 05.07.2012 | √ |
| 8 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 24.07.2012 | √ |
| 9 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 17.07.2012 | √ |
| 10 | ලංකා එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම | 12.10.2012 | අදාල නොවේ |
| 11 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 06.08.2012 | √ |
| 12 | නාගරික සංවර්ධන අධිකාරිය | 08.08.2012 | √ |
| 13 | රාජ්‍ය උපයෝගීතා කොමිෂන් සභාව | 09.08.2012 | √ |
| 14 | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 10.08.2012 | √ |
| 15 | මහජන බැංකුව | 10.08.2012 | √ |
| 16 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 14.08.2012 | √ |
| 17 | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | 12.11.2012 | √ |
| 18 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 18.09.2012 | √ |
| 19 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 14.11.2012 | √ |
| 20 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 21.09.2012 | √ |
| 21 | පොල් සංවර්ධන අධිකාරිය | 01.10.2012 | √ |
| 22 | සැලසිනේ රූපවාහිනී ආයතනය | 05.10.2012 | √ |
| 23 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 12.10.2012 | √ |
| 24 | ආයුර්වේද ඖෂධ නීතිගත සංස්ථාව | 16.10.2012 | √ |
| 25 | සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | 24.10.2012 | √ |
| 26 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 15.11.2012 | √ |
| 27 | ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 16.11.2012 | √ |
| 28 | ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 16.11.2012 | √ |
| 29 | ජාතික චිත්‍රපටි සංස්ථාව | 19.11.2012 | √ |
| 30 | ලංකා නැව් සංස්ථාව | 20.11.2012 | √ |
| 31 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 21.11.2012 | √ |
| 32 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | 05.12.2012 | √ |
| 33 | ලංකා බැංකුව | 22.11.2012 | √ |
| 34 | මිහින් ලංකා සමාගම | 26.11.2012 | √ |
| 35 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 07.12.2012 | √ |
| 36 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | 29.11.2012 | √ |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 03.12.2012 | √ |
| 38 | ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය | 04.12.2012 | √ |

| | | | |
|---|---|---|---|
| 39 | වී අලෙවි මණ්ඩලය | 05.12.2012 | √ |
| 40 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 06.12.2012 | √ |
| 41 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 07.12.2012 | √ |

***මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව***

## 1.2 කාර්යය සාධනය

### 1.2.1 ලාභාංශ

2011 වර්ෂයේ රජයට අයත් වාණිජ ව්‍යවසායයන්ගෙන් අයභාර හා ලාභාංශ වශයෙන් ලද ආදායම රු. මිලියන 24,562 ක් වූ අතර 2012 වර්ෂයේ එම ආදායම රු. මිලියන 27,549 දක්වා සියයට 12.1 කින් වර්ධනය වී ඇත. මෙම අයභාර හා ලාභාංශ ආදායම සමස්ත බදු නොවන ආදායමෙන් සියයට 20 කට ආසන්න ප්‍රතිශතයක් නියෝජනය කරනු ලබයි. රාජ්‍ය ව්‍යවසායයන් සියල්ලටම වාගේ සැලකිය යුතු ආදායම් ඉපයීමේ අවස්ථාවන් ඇති අතර ඔවුන් සතු ශක්තිමත් වත්කම් සමුදාය සමස්ත දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 30 කට ආසන්න ප්‍රතිශතයක් නියෝජනය කරන අතර එය කොළඹ ව්‍යාපාර වස්තු වෙළඳපල හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් සියල්ල කරන ලද ප්‍රාග්ධනිත කිරීම් එකතුවට වඩා වැඩිය. රජය සතු වාණිජ ව්‍යවසායයන් 2000 වර්ෂයේ සිට උපයන ලද ලාභාංශ ප්‍රමාණය මේ දක්වා ප්‍රශස්ත මට්ටමට ලඟාවී නොමැති අතර එහි සැලකිය යුතු වර්ධනයක් අවශ්‍ය වේ.

කෙසේ වුවද මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපානු ලැබුවේ රාජ්‍ය බැංකු සහ රක්ෂණ සමාගම් විසින් සිදු කරන ලද ලාභාංශ පැවරුම් හේතුවෙන් වන අතර එය ලැබූ සමස්ත ලාභාංශ ආදායමෙන් සියයට 80 ක ප්‍රතිශතයකට ආසන්න විය. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ ලංකා ඛනිජ වැලි සමාගම 2011 වර්ෂය හා සැසඳීමේදී 2012 වර්ෂය තුල වැඩි ලාභාංශ ප්‍රමාණයක් ගෙවා ඇත. කෙසේ වුවද ප්‍රාග්ධන ව්‍යාප්ති ආයෝජනයන් හේතුවෙන් ජාතික ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සිවිල් ගුවන් සේවා සමාගම වැනි විශාල ව්‍යවසායයන්ගෙන් සහ විශාල අලාභයක් ලැබූ ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් සමාගම වැනි ආයතනයන්ගෙන් රජයට ලාභාංශ ලැබී නොතිබිනි.

සාපේක්ෂ වශයෙන් කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යවසායයන් වන ජාතික ලොතරැයි මණ්ඩලය, ස්වාධීන රූපවාහිනී ජාලය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ වැලි සමාගම, හලාවත, කුරුණෑගල යන වැවිලි සමාගම් 2011 වර්ෂයේ ගෙවන ලද රු. මිලියන 734 ක් වූ ලාභාංශ ප්‍රමාණයට සාපේක්ෂව රු. මිලියන 2,435 ක් වූ සතුටුදායක ලාභාංශ ප්‍රමාණයක් 2012 වර්ෂයේ ගෙවා ඇත. එසේ වුවත්, අලෙවිකරණ හා බෙදා හැරීම් අංශයේ නිරත ලක්සල හා ලක් සතොස වැනි ව්‍යවසායයන්ගේ ලාභදායීත්වයේ ඒකාකාර වර්ධනයක් පෙන්නුම් කළ ද ලාභාංශ ලැබී නොමැත.

## රජය සතු වාණිජ ව්‍යාපාරයන්ගෙන් ලද අයභාර/ලාභාංශ ආදායම

| | 2002 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|
| **අයභාර** | **-** | **1,316** | **1,434** | **1,279** | **4,471** | **4,524** | **10,379** | **13,562** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | - | 810 | 1,060 | 1,060 | 1,750 | 2,312 | 4,560 | 8,260 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | - | 116 | 25 | - | 50 | - | - | 25 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | - | 46 | 50 | 40 | 144 | 55 | - | 500 |
| රාජ්‍ය දැව සංස්ථාව | - | 75 | 150 | 75 | 50 | 10 | 75 | 50 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - | 25 | 30 | 40 | 30 | 85 | 59 | 20 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | - | 115 | 65 | - | - | - | - | - |
| ජාතික රක්ෂණ භාර අරමුදල | - | | | | 2,250 | 2,000 | 3,495 | 4,200 |
| ලංකා විදුලිබල මණ්ඩලය | - | - | - | - | - | - | 2,000 | - |
| වෙනත් * | - | 129 | 54 | 64 | 197 | 62 | 190 | 507 |
| **ලාභාංශ** | **435** | **3,585** | **4,014** | **2,966** | **4,219** | **6,867** | **14,183** | **13,987** |
| ලංකා බැංකුව | - | 1,173 | 846 | 1,046 | 1,346 | 2,923 | 4,020 | 5,346 |
| මහජන බැංකුව | - | 668 | 1,416 | 816 | 1,139 | 3,253 | 4,500 | 4,658 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 300 | 670 | 893 | 893 | 893 | 223 | 536 | 759 |
| ඩෙ ලා රූ ලංකා පුද්ගලික සමාගම | 20 | - | 100 | 100 | 38 | - | 68 | 42 |
| ලංකා ඛණිජ වැලි සංස්ථාව | - | 98 | 50 | 34 | 60 | 35 | 500 | 1,700 |
| ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට් ලිමිටඩ් | 11 | 20 | 62 | 31 | 31 | 31 | 31 | 47 |
| ශ්‍රී ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම | - | - | 438 | - | - | - | - | - |
| ගුවන්තොටුපල හා ගුවන් සේවා සමාගම | - | - | 100 | - | 200 | - | 2406 | - |
| වෙස්ට් කොස්ට් බලශක්ති පුද්ගලික සමාගම | - | - | - | - | 392 | - | - | - |
| ලංකා විදුලි සමාගම | 100 | 100 | 75 | - | | 300 | - | 75 |
| වැවිලි සමාගම් ** | - | - | - | - | 30 | - | 212 | 179 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | - | - | - | - | - | - | 1,750 | 1,001 |
| ශ්‍රී ලංකන් ගුවන් සමාගම | - | 788 | - | - | - | - | - | - |
| වෙනත් * | 4 | 68 | 34 | 46 | 90 | 102 | 160 | 180 |
| **එකතුව** | **435** | **4,901** | **5,448** | **4,245** | **8,690** | **11,391** | **24,562** | **27,549** |

*මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

** ස්වාධීන රූපවාහිනී ජාලය, ජාතික ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව" රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව" ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව" ලංකා පොස්පේට් සමාගම, ලංකා ලේලන්ඩ් සමාගම" සිලෝන් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස්" කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, පරන්තන් කෙමිකල්ස් සමාගම, රක්නා ආරක්ෂක ලංකා සමාගම, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව..*

*** හලාවත, කළුබෝවිටියාන, ඇල්කඩුව, කුරුණෑගල, නමුණුකුල, කෑගල්ල, අගලවත්ත, කොටගල, බලංගොඩ, වටවල, හොරණ, ඇල්පිටිය සහ පුස්සැල්ලාව වැවිලි සමාගම්.*

### 1.2.2 සේවා නියුක්තිය

2012 වසරේ රජයට අයත් වාණිජ ව්‍යවසායයන්හි සමස්ථ සේවා නියුක්තිය 251,278 විය. එය 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 1 ක වර්ධනයකි. කෙසේ වුවද මෙම ව්‍යවසායයන්හි සේවක වැටුප් හා වේතන වැඩිකිරීම හේතුවෙන් 2011 වර්ෂයේ රු. 398,400 ක් වූ සේවකයෙකු සඳහා වූ සාමාන්‍ය වාර්ෂික වැටුප 2012 වර්ෂයේදී රු. 469,185 දක්වා වැඩිවී ඇත. 2012 වර්ෂය තුළ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 17.7 ක වැටුප් වැඩිවීමක් වාර්තා වූ අතර එම කාලය තුළ මධ්‍යම රජයේ සේවකයින්ගේ වාර්ෂික වැටුප් වැඩිවීම සියයට 6.8 ක් පමණක් විය. ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතනයන්හි සාමුහික ගිවිසුම් පදනම් කොට ගෙන සිදුකරන ලද වැටුප් වැඩිවීම්" මෙම වැටුප් වැඩිවීම සඳහා විශාල වශයෙන් බලපා ඇත. 1992 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිව්‍යුහගත කරන ලද බැංකු හැර අනෙකුත් රාජ්‍ය ව්‍යවසායයන්හි සියළුම සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කරන ලදී.

### 1.2.3 රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා දීම

රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත අයවැය ප්‍රතිපාදන යටතේ ණය සහන ප්‍රදානයන් ඇතුලත්ව රු. බිලියන 32.2 ක් ලබාදී ඇති අතර එය 2011 වර්ෂය හා සාපේක්ෂව සියයට 16 ක වැඩිවීමකි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකන් එයාලයින්ස් සමාගම වැනි තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන් වෙත බැංකු මාර්ගයෙන් ණය පහසුකම් ලබාගැනීමට ප්‍රවේශ වීමේ හැකියාව ලබාදෙමින් රු. බිලියන 321 ක රජයේ ඇප සහතික ලබාදී ඇත. රජය සතු බොහෝ වාණිජ ව්‍යවසායයන් ඔවුන්ගේ ආදායමේ වාර්තාගත වර්ධනයක් වාර්තා කර ඇති හෙයින් 2011 වර්ෂයේ රු. මිලියන 4,891 ක් වූ පුනරාවර්තන ප්‍රතිපාදන රු. මිලියන 4,285 ක් දක්වා සියයට 12.4 කින් 2012 වර්ෂය තුල අඩුවී ඇති බව වර්තා කරයි.

2011 වර්ෂයේ රු. මිලියන 23,618 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන 2012 වර්ෂය තුල රු. මිලියන 27,930 දක්වා සියයට 18 ක ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති අතර දැනට ක්‍රියාත්මක රාජ්‍ය ආයෝජනයන්ට අනුබල දෙමින් ලද උප ණය ප්‍රමාණය රු. මිලියන 37,544 දක්වා වර්ධනය වී ඇත. සමස්ත ප්‍රාග්ධන සහ උප ණය එකතුව සමස්ත ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 3.5 කට ආසන්න වන අතර, එය 2012 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 1.2 කි.

## 2. රාජ්‍ය ව්‍යාවසායන්හි සමාලෝචනය

### 2.1 සමාලෝචනය

වරාය, ගුවන්තොටුපල, ජලය, විදුලිය, ඛනිජ තෙල්, බැංකු සහ රක්ෂණ යන ක්ෂේත්‍රයන්හි රජයට අයත් වාණිජ ව්‍යවසායයන් දහයක් විසින් ජාතික ආර්ථිකයෙහි උපාය මාර්ගික කාර්යයන් ඉටු කරනු ලැබේ. දැනට ක්‍රියාකාරීව පවතින රාජ්‍ය ව්‍යවසායයන් 55 සතු වත්කම් පදනමෙන් සියයට 95 ක් මෙම ව්‍යවසායයන් සතුව පවතී. ශ්‍රී ලංකා

වරාය අධිකාරිය, ගුවන්තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලි බල මණ්ඩලය, හා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මූල්‍යමය නොවන අංශයේ රාජ්‍ය ව්‍යවසායයන් අතර මූලිකත්වය ගන්නා අතර, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් බැංකු හා රක්ෂණ අංශයෙහි ප්‍රධානත්වය උසුලනු ලැබේ. 2005 සිට රජය විසින් අනුගමනය කරන්නා වූ රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය නොකිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් මෑත කාලයේ දී ලක් සතොස, ලක්සල, ලංකා ධීවර සංස්ථාව, සී/ස ලංකා පොහොර සංස්ථාව, මිල්කෝ සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අනෙකුත් ව්‍යවසායයන් අතර සාපේක්ෂ වශයෙන් වැඩි කාර්යසාධනයක් අත්පත් කරගෙන ඇත. තරඟකාරි වෙළඳපොළ තත්ත්වයන් තුළ අඩු ආදායම්ලාභීන්ට මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතා ඉටු කරමින් මෙතෙක් අඩු අවධානයක් යොමු වූ ප්‍රදේශයන්ට පොහොර වැනි අවශතාවයන් සම්පූර්ණ කිරීමට ස්වාභාවික සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් හා වත්කම් ප්‍රශස්ථව උපයෝජනය කිරීම ලංකා ඛනිජ වැලි සමාගම, පොස්පේට් සමාගම වැනි ආයතනවල උපායමාර්ගික කාර්යභාරය වන්නේය. එබැවින් ඒවායේ පිරිවැටුම සැහෙන තරම් විශාල නොවූවත්, මෙම ව්‍යවසායයන් සතු කාර්යභාරය වැදගත් වේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ සහ භාණ්ඩාගාරය මගින් සිදුකරන අධීක්ෂණය හේතුවෙන් රජයට අයත් බොහෝ වාණිජ ව්‍යවසායයන්ගේ අභ්‍යන්තර පරිපාලන සහ ව්‍යාපාර කටයුතු වර්ධනය වී ඇත. එසේවුවද, අදාල නීතිරීති රෙගුලාසි හා අනුගතවීම කාර්ය පද්ධති සහ පරිපාටි අනුගමනය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල සහ ඉහළ කළමනාකරණය සතු වගවීම තහවුරු කිරීමේ දී තවදුරටත් වැඩිදියුණු කිරීම් අවශ්‍ය වේ. බොහෝ ව්‍යවසායයන් විසින් ආදායම් උපදවන ක්‍රියාකාරකම්හි සිදු කරන දිගු කාලීන ආයෝජනයන් මගින් සිය වෙළඳපොළ ස්ථායීභාවය තහවුරු කිරීම සහ ශේෂපත්‍ර ශක්තිමත් කිරීම සඳහා සිය ව්‍යාපාර කටයුතු නැවත සැලසුම් කරමින් සිටීම සාධනීය තත්ත්වයකි. ඇතැම් ව්‍යවසායයන් සතු සමස්ත හැකියාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රාග්ධන සැපයීම් සහ ප්‍රබල වෘත්තීයවේදී සහ කළමනාකරණ හැකියාවන් අවශ්‍ය වේ.

මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් 55 හි ක්‍රියාකාරීත්වය තරඟකාරී වෙළඳපොල පරිසරයක් තුළ ක්‍රියාත්මක වේ. රාජ්‍ය ව්‍යවසායයන් සියල්ලක් ම පාහේ තම මෙහෙයුම් තුලනාත්මකව ශක්තිමත් දේශීය පුද්ගලික ව්‍යවාසයයන් හා ඇතැම් අංශවල දී විදේශීය ආයතනද සමඟ තරඟකාරී වෙළඳපොලෙහි ක්‍රියාත්මක වේ. බැංකු සහ රක්ෂණ අංශ ඒවායෙහි ක්‍රියාකාරීත්වයෙහි ගුණාත්මකභාවය, ආයතන ස්ථායීභාවය සහ මනා තරඟකාරීත්වය තහවුරු කිරීම සඳහා නියාමනය කරන අතර රාජ්‍ය බැංකු සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙළඳපොළ තරඟකාරීත්වය මධ්‍යයේ ශක්තිමත්ව පවතී. වෙළඳපොළ ක්‍රියාකාරීත්වය අඩු ආදායම් ලාභී කණ්ඩායම් සහ රටේ වඩා දුෂ්කර ප්‍රදේශ සඳහා පහසුකම් සැලසීම තහවුරු නොවන බැවින් කෘෂිකර්මය, සිල්ලර වෙළඳාම, මාධ්‍ය, ප්‍රවාහනය යන බොහෝ ආර්ථික අංශවලදී රාජ්‍ය ව්‍යවසායයන්ගේ මනා ක්‍රියාකාරීත්වය අවශ්‍ය වේ. බොහෝ ව්‍යවසායයන් තරඟකාරී පරිසරයක් තුළ සිය ක්‍රියාකාරීත්වයෙහි වර්ධනයක් පෙන්නුම් කරන අතර ඇතැම් ව්‍යවසායයන්ට සිය වෙළඳපොළ කොටස් අහිමිවීම හේතුවෙන් සැලකිය යුතු ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි අයිතියෙහි වෙනසක් සිදු නොකර අවශ්‍ය වෙනස්කම් ඇති කිරීම තුළින් මනා ශක්‍යතාවයකින් යුත් ආයතනයක් බවට පත් කිරීම සඳහා මෙන්ම ශක්තිමත් වෙළඳපොළක් අත්පත්කර ගැනීමක් සඳහාද එම ව්‍යවසායයන්හි කළමනාකාරීත්වය විසින් ඔවුන්ගෙන් බලාපොරොත්තු වන කාර්යභාරය මනා ලෙස ඉටු කිරීමට සුවිශාල කැපකිරීමක් කළ යුතු වේ.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් යෝජනාකර ඇති පරිදි තම ශක්‍යතාවයට වඩා අඩු මට්ටමක ක්‍රියාත්මක වන්නා වූ හෝ ඵලදායී සමාජ ආර්ථික සේවයක් ඉටු කළ නොහැකි කුඩා ආයතන සඳහා ආයෝජන

සහ ප්‍රතිසංස්කරණ සැලසුම් සහිත ප්‍රතිව්‍යුහගත කිරීම්, ඒකාබද්ධ කිරීම් මෙන්ම ඇතැම් අවස්ථාවල දී ඈවර කිරීම්ද අවශ්‍ය වේ. 2.18 වගුවෙහි ඒවා ලැයිස්තුගත කර ඇත.

## 2.2 බලශක්ති

පරිසර හිතකාමී හා පිරිවැය දැරිය හැකි ඵලදායී මූලාශ්‍රයන්ගේ සංවර්ධනය තුළින් දිගු කාලීන හා මධ්‍ය කාලීන බලශක්ති අවශ්‍යතාවය තහවුරු කිරීම රජයේ බලශක්ති ප්‍රතිපත්තියේ ප්‍රමුඛතාවය වේ. 2005-2012 කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද රු. බිලියන 224.1 වූ ආයෝජන මගින් බලශක්ති නිපදවීම සම්ප්‍රේෂණය හා බෙදා හැරීමට අදාළ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු වී ඇත. 2002 වර්ෂයේ මෙ.වොට් 2,231 ක් ව පැවති සමස්ත විදුලිබල නිෂ්පාදන ධාරිතාව මෙ.වොට්. 3,312 ක් දක්වා සියයට 48 කට ආසන්න ප්‍රතිශතයකින් 2012 වර්ෂය වන විට වර්ධනය කර ඇත. මෙහිදී ඉන්ධන ආශ්‍රිත විදුලිබල නිෂ්පාදනය අඩු කිරීම සඳහා මෙ.වොට් 300 ක ධාරිතාවයකින් යුත් ගල් අඟුරු බලාගාරයක් පුත්තලමේ ස්ථාපිත කිරීම හා මෙ.වොට්. 125 ක ධාරිතාවයකින් යුත් ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය ස්ථාපිත කිරීම සිදුකර ඇත. 2014 වර්ෂය ආරම්භයේ තවදුරටත් මෙ.වොට් 600 කින් යුත් ගල් අඟුරු ආශ්‍රිත විදුලි ජනන ධාරිතාවයක් සමස්ත විදුලිබල පද්ධතියට එකතු කිරීම සඳහා මේ වන විට පුත්තලමේ බලාගාරයක් ඉදිකෙරෙමින් පවතී.

2002 වර්ෂයේ සියයට 17.3 ක් වූ පද්ධති අලාභය 2012 වර්ෂයේදී සියයට 11.7 දක්වා අඩු වීම සහ 2002 වර්ෂයේ සියයට 65 ක් වූ ගෘහස්ත ඒකක සඳහා විදුලිය සැපයීම 2012 වර්ෂයේ සියයට 93 කට ආසන්න ප්‍රතිශතයකට වර්ධනය කිරීමත් සහ අනෙකුත් කර්මාන්ත හා පොදුකාර්යයන් සඳහා විදුලිය සැපයීම සහ මධ්‍ය කාලීන මූල්‍යමය වශයෙන් ශක්‍යතාව වර්ධනය කරමින් නිවැරදි දිසා වෙත ගමන් කිරීමත් තුලින්, සැමට විදුලි බලය වෙත ප්‍රවේශවීමේ හැකියාව ලබා දී ඇත. එසේ වුවද දිගින් දිගටම පැවති නියගය හේතුවෙන් 2012 වර්ෂයේ දෙවන හා තුන්වන කාර්තුවල විදුලිබල නිෂ්පාදන හැකියාව තව දුරටත් දුර්වල විය. තවද, ජාත්‍යන්තර වෙළඳපලේ ඛනිජ තෙල් මිල ඉහළ ගොස් තිබියදීත් ඉන්ධන ආශ්‍රිත විදුලි නිෂ්පාදන බලාගාර මත යැපීම තවදුරටත් වර්ධනය විය. 2012 වර්ෂයේ පෙබරවාරි මස විදුලිගාස්තු සංශෝධන කිරීම හා රු. බිලියන 54 ක වටිනාකමක් සහිත සහනාධාර මිල ගණන් යටතේ ඉන්ධන ලබා ගැනීමට හැකියාව ලැබුණද 2012 වර්ෂයේ ලංවිම යේ මෙහෙයුම් අලාභය රු. බිලියන 61 ක් දක්වා වැඩි වී ඇත.

2012 වර්ෂය තුළ ඛනිජ තෙල් නිෂ්පාදනයන් සඳහා වූ ඉල්ලුම සියයට 5 ක ප්‍රතිශතයකින් වර්ධනය විය. සමස්ත විදුලිබල පරිභෝජනයෙන් සියයට 56 ක ප්‍රතිශතයක් ප්‍රවාහන අංශය නියෝජනය කර ඇති අතර සියයට 25 ක ප්‍රතිශතයක් විදුලිබල අංශය නියෝජනය කර ඇත. ජල විදුලිබල නිෂ්පාදන ධාරිතාවය සියයට 20 කින් අඩු වීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම 2011 වර්ෂයට වඩා සියයට 20 ක ප්‍රතිශතයකින් වාර්තාගත වැඩි වීමක් ලබා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපලේ ඛනිජ තෙල් මිල බැරලයක් ඇ.ඩො. 110 ක් වැනි ඉහළ මට්ටමක පැවතියද ඛනිජ තෙල් ආනයනය වැඩි වී ඇත. 2011 වර්ෂයේ ඛනිජ තෙල් ආනයනය සඳහා දරන ලද ඇ.ඩො.මි. 4,795 ක් හා සැසඳීමේ දී 2012 වර්ෂයේ දරන ලද පිරිවැය ඇ.ඩො.මි. 4,919 කි.

ජාත්‍යන්තර වෙළඳපලේ ඛනිජ තෙල් බැරලයක මිල ගණන් ඇ.ඩො. 95 සිට ඇ.ඩො. 125 දක්වා උච්ඡාවචනය

වුවද ආනයනය කල බොරතෙල් බැරලයක මිල ඇ.ඩො. 114.73 ක් විය. ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩි වීම සහ ඉරානයෙන් ඛනිජ තෙල් ආනයනයට අදාළව ජාත්‍යන්තරය පනවන ලද සීමාවන් හේතුවෙන් ඛනිජ තෙල් පිරිපහදුව මුහුණ දුන් බාධක සමඟ බද්ධ වීමේ ප්‍රතිඵලයක් ලෙස 2011 වසරේ මෙ.ටොන් මිලියන 3.5 ක් වූ ඛනිජ තෙල් සංස්ථාවේ පිරිපහදු කරන ලද තෙල් ආනයනය 2012 වසරේ මෙ.ටොන් මිලියන 3.95 ක් දක්වා වැඩි වී ඇත. 2011 වර්ෂය සමඟ සන්සන්දනයේදී ඛනිජ තෙල් සංස්ථා පිරිපහදුවේ භාවිතා කරන ලද ධාරිතාවය 2012 වර්ෂය තුළ සියයට 33 කින් පහළ බසින ලදී. මෙකී සාධක හේතුවෙන් 2012 වසරේ පෙබරවාරි සහ දෙසැම්බර් මාසයන් වලදී ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි මිල ගණන් ඉහළ දැමුවද 2012 වර්ෂයේ ඛනිජ තෙල් සංස්ථාවේ මූල්‍ය අලාභය (රු. බිලියන 54 ක් වූ ලංවිමට සහනදායී පදනමක් මත සපයන ලද ඉන්ධනද ඇතුළුව) රු. බිලියන 89 දක්වා වැඩි වී ඇත.

විදුලිබල සැපයුමේ අඛණ්ඩ වර්ධනයට සැලකිල්ලට ගැනීමේ දී වර්ෂයට සියයට 7 ක ඉල්ලුමේ වර්ධනයක් වේ යැයි අපේක්ෂා කරන අතර 2013 - 2015 කාලය තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉල්ලුම වාර්ෂිකව සියයට 10 කින් වැඩි වේ යැයි අපේක්ෂා කරයි. මෙම කරුණු සැළකිල්ලට ගැනීමේ දී පෙට්‍රල් සඳහා වන ඉල්ලුම වාර්ෂිකව සියයට 9 කින් වර්ධනය වේ යැයි පුරෝකථනය කර ඇත. වසර 40 ට පමණ පෙර ස්ථාපනය කරන ලද ඛනිජ තෙල් සංස්ථා පිරිපහදුවේ දෛනික පිරිපහදු ධාරිතාවය තෙල් බැරල් 25,000 ක් පමණ වන අතර 2005 වසරේ සමස්ත පෙට්‍රල් ඉල්ලුමෙන් සියයට 50 ක් ද ඩීසල් සියයට 40 ක් ද බැර ඉන්ධන හා භූමිතෙල් සමස්ත ඉල්ලුම ද සපුරා ඇත. නමුත් මෙම වසරේ පෙට්‍රල් ඉල්ලුමෙන් සියයට 28 ක් ද ඩීසල් සියයට 18 ක් පමණ ද සපුරාගෙන ඇති අතර බැර ඉන්ධන හා භූමිතෙල් ඉල්ලුමෙන් කොටසක් ආනයනය මගින් සපුරා ගැනීමටද සිදුව ඇත. පසුගිය කාල වකවානුව තුළ පිරිපහදුව සංවර්ධනයට අදාළ ප්‍රමාණවත් ආයෝජනයක් නොමැති වීමෙන් තෙල් පිරිපහදුවේ නිමැවුම, යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපන ආධාර ලබා දුන්නද මෙ.ටො. මිලියන 2 සිට මෙ.ටො. මිලියන 1.5 දක්වා අඩුවීමක් වාර්තා කරන ලද අතර එය ඛනිජ තෙල් සංස්ථාවේ කාර්යක්ෂමතාව දුර්වල වීමට හේතු විය.

## 2.3 ජලය

පිරිසිදු පානීය ජල සැපයුම හා සනීපාරක්ෂාව රජයේ ප්‍රධාන සංවර්ධන අරමුණකි. මෙරට පිරිසිදු පානීය ජල අවශ්‍යතාවයෙන් සියයට 35 ක් සපයනු ලබන්නේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වන අතර 2016 වන විට එය සියයට 46 ක් දක්වා ඉහළ දැමීම ඔවුන්ගේ අරමුණයි. 2012 අවසාන වන විට රටතුල පිරිසිදු පානීය ජල සැපයුම සියයට 84 දක්වා වර්ධනය වී තිබූ අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 2 ක වර්ධනයකි. 2016 වන විට එකී ජල සැපයුම සියයට 94 ක් දක්වා ඉහළ දැමීමට අපේක්ෂා කෙරේ. ප්‍රජා මූල සංවිධාන හා පළාත් පාලන ආයතන මගින් මෙරට පානීය ජල අවශ්‍යතාවයෙන් සියයට 8 ක් ආවරණය කරනු ලබන අතර, ජනගහනයෙන් සියයට 41 ක් ලිං, අත්පොම්ප, නල ලිං, වැසි ජලය හා උල්පත් වැනි මූලාශ්‍ර මගින් තම පානීය ජල අවශ්‍යතාවය සපුරාගනී.

2012 වර්ෂයේදී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රු. මිලියන 8,826 ක් වැය කරමින් ජලසම්පාදන යෝජනා ක්‍රම 337 ක් හරහා පානීය ජලය ඝන මීටර් මිලියන 526 ක් නිෂ්පාදනය කළ අතර එය 2011 නිපදවූ ඝන මීටර් මිලියන 490 ට සාපේක්ෂව සියයට 7 ක වර්ධනයකි. 2011 දී රුපියල් 14.86 ක් වූ ජලය ඝන මීටරයක් සඳහා වන නිෂ්පාදන පිරිවැය 2012 වසරේදී රුපියල් 16.80 දක්වා සියයට 13 කින් වැඩි විය. එසේම මහා

පරිමාණ ආයෝජනවල ප්‍රතිඵලයක් වශයෙන් 2012 අවසානයේදී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල නිෂ්පාදන ධාරිතාව ඝන මීටර් 185,791 කින් වර්ධනය විය.

ජල සම්බන්ධතා 1,587,663 ක් හා බවුසර් මගින් 2012 වසර තුලදී ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජලය ඝන මීටර් මිලියන 368 ක් බෙදා හරින ලද අතර එය 2011 වසරේදී බෙදාහරින ලද ජලය ඝන මීටර් මිලියන 342 ට සාපේක්ෂව සියයට 8 ක වර්ධනයකි. 2012 වසරේදී මණ්ඩලයේ ආදායම රු. බිලියන 16.3 ක් වූ අතර එය 2011 වසරට සාපේක්ෂව සියයට 11 ක වර්ධනයකි. 2012 දී රු. බිලියන 13.1 ක් වූ ජල අලෙවි ආදායම මුළු ආදායමෙන් සියයට 85 කි. සැමට පිරිසිදු පානීය ජලය සැපයීමේ රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව 2012 දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජල සම්බන්ධතාවයන් 138,362 කින් වර්ධනය කර ගැනීමට සමත් වී ඇත.

කෙසේ වෙතත්, 2012 දී ආදායම් නොලබන ජලය (බෙදාහැරීමේ පද්ධතියේ පවතින කාන්දුවීම් තුලින් නිරන්තරයෙන් අපතේ යන ජලය) ඝන මීටර් මිලියන 157 ක් වාර්තා වූ අතර එය මුළු නිෂ්පාදනයෙන් සියයට 29.9 කි. 2008 දී සියයට 34 ක් වූ ආදායම් නොලබන ජලය 2012 දී සියයට 29.9 ක් දක්වා ප්‍රතිශතමය වශයෙන් අඩුකර ගැනීමට මණ්ඩලයට හැකිවී ඇත. එසේ වුවත් ප්‍රමාණාත්මක වශයෙන් ගත්විට 2008 දී ඝන මීටර් මිලියන 141 ක් වූ ආදායම් නොලබන ජලය 2012 දී ඝන මීටර් මිලියන 157 ක් දක්වා වැඩිවී ඇත. ජාත්‍යන්තර මට්ටම වන සියයට 15 දක්වා ආදායම් නොලබන ජලය අඩුකර ගැනීමට මණ්ඩලයට හැකියාව ලැබුනේ නම් ඔවුන්ගේ ජල අලෙවිය ඝන මීටර් මිලියන 94 කින් වර්ධනය කර ගැනීමට හැකිව තිබූ අතර එමගින් මෙරට පිරිසිදු පානීය ජල අවශ්‍යතාවයෙන් සියයට 10 ක් ආවරණය කෙරෙනු ඇත. එසේම එයින් ජනනය කළ හැකිව තිබූ ශුද්ධ වාර්ෂික ආදායම රු. බිලියන 3.4 කි.

සියයට 25 ක වැටුප් වැඩිවීම හේතුකොටගෙන 2012 දී මණ්ඩලයේ පිරිවැය පෙර වසරට සාපේක්ෂව සියයට 37 කින් වැඩිවී ඇත. ඒ හේතුවෙන් පෙර වසරේ ගිණුම්මය ලාභය වූ රු. මිලියන 421 ක ප්‍රමාණය රු. මිලියන 579 ක ගිණුම්මය පාඩුවක් බවට පත්විය. රු. මිලියන 3,898 ක් වටිනා තොග පවත්වාගෙන යාම මණ්ඩලයේ ද්‍රවශීලතාවය කෙරෙහි ඍණාත්මක බලපෑම් ඇතිකර තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදු නොවන අතර, එනිසා 2011 වසර අවසානයේදී භාණ්ඩාගාරයට ගෙවිය යුතු හිඟ හිටි ණය ප්‍රමාණය වූ රු. මිලියන 3,074 ට සාපේක්ෂව 2012 දී එකී ප්‍රමාණය රු. මිලියන 5,281 ක් දක්වා වර්ධනය වී ඇත.

ජල ඒකකයක් සඳහා අය කරන මිල හා ජල ඒකකයක් පාරිභෝගිකයා වෙත ලබාදීමට වන පිරිවැය අතර පවත්නා හිඩැස පියවීම අරමුණ කර සියයට 33 කින් ජල බද්ද 2012 වර්ෂය අවසානයේදී සංශෝධනය කරන ලදී. එසේ වුවත් මිලියන 1.2 ක් වූ මුළු ගෘහස්ථ පාරිභෝගික සංඛ්‍යාවෙන් ඒකක 25 ට අඩුවෙන් පරිභෝජනය කරන පිරිස සියයට 85 ක් වන අතර ඔවුන්ට ඒකකයක් සඳහා රු.9 සිට රු.30 දක්වා සහනාධාරයක් හිමිවන අතරම ඒ සඳහා වන වාර්ෂික පිරිවැය රු. මිලියන 3,290 කි.

2012 වර්ෂයේදී ජල ඒකක මිලියන 368 ක් පරිභෝජනය කරන ලද අතර ඉන් සියයට 72 ක් ගෘහස්ථ අංශය විසින් ද ඉතිරි සියයට 28 කාර්මික අංශය විසින් ද පරිහරණය කරන ලදී. කෙසේ වෙතත්, ගෘහස්ථ අංශය විසින් මණ්ඩලයේ මුළු ආදායමට දක්වන ලද දායකත්වය සියයට 55 ක් වූ අතර එම ප්‍රමාණය රු. මිලියන 7,455 කි.

එසේම මණ්ඩලයේ මුළු ආදායමෙන් සියයට 45 ක් සඳහා කාර්මික අංශය දායක වූ අතර එමගින් ලැබූ ලාභය රු. මිලියන 1,688 කි.

ජල සම්බන්ධතා ප්‍රමාණය වැඩිකිරීම හා 2016 වන විට ආදායම් නොලබන ජල ප්‍රමාණය සියයට 20 දක්වා අඩුකිරීම අරමුණු කරගෙන රජය විසින් ගනු ලැබූ දැඩි ආයෝජන උපාය මාර්ග හේතුවෙන් මධ්‍යකාලීනව මණ්ඩලයේ ශේෂපත්‍රය ශක්තිමත් වනු ඇති අතර 2013 සිට අතිරික්තයක් වාර්තා කිරීමට ද ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකිවනු ඇත. ශේෂපත්‍රය ශක්තිමත් වන විට මණ්ඩලයේ අනාගත වර්ධනය උදෙසා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සපයා ගැනීමට ඔවුන්ට හැකිවනු ඇත. රු. බිලියන 106.4 ක් පමණ වන මහා පරිමාණ ව්‍යාපෘති කළඹ මනාව කළමනාකරණය කරගැනීමට හා මෙහෙයුම් පිරිවැයෙන් 1/4 ක් පමණ වන බලශක්ති පිරිවැය දරා ගැනීමට මණ්ඩලය සතු හැකියාව මත ඔවුන්ගේ තිරසාර පැවැත්ම රඳා පවතිනු ඇත.

2012 වසර අවසාන වනවිට, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති 26 ක් වූ අතර ඒවා ව්‍යාපෘති චක්‍රයේ විවිධ අදියරයන්හි පවතී. 2005 - 2012 කාල පරිච්ඡේදය තුළ මහා පරිමාණ ජල ව්‍යාපෘති 36 ක් සම්පූර්ණ කිරීමට මණ්ඩලයට හැකියාව ලැබූ අතර, එමගින් වාර්ෂික ජල නිෂ්පාදන ධාරිතාව ඝන මීටර් 552,609 ක් දක්වා වර්ධනය වී ඇත. මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති වැඩි ප්‍රමාණයකටම පොදු ලක්ෂණය වන්නේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලින් වැඩි ප්‍රමාණයක් අපේක්ෂිත කාලසීමාවන් යටතේ නිම කිරීමට නොහැකි වීමෙන් අතිරේක පිරිවැයක් දැරීමට සිදු වීමයි. සමහර අවස්ථාවන්හි දී එය මුල් පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට සියයක් පමණ වේ. ප්‍රසම්පාදන ක්‍රියාවලියන්හි ඇති ප්‍රමාදවීම් උක්ත අතිරේක පිරිවැය තත්ත්වයන්ට ප්‍රධාන හේතුව වී ඇති අතර, ව්‍යාපෘති සැලසුම්කරණ අවස්ථාවේදී සිදුකරන දුර්වල ශක්‍යතා අධ්‍යයන සහ ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතා ද ඒ අතර වේ. බොහෝ අවස්ථාවල මෙම අතිරේක පිරිවැය තත්වයන් හේතුවෙන් ව්‍යාපෘති නිමකිරීම සඳහා අමතර මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට රජයට සිදුවන අතර එය රාජ්‍ය අයවැය මත අතිරේක බරක් ඇති කරන්නකි.
පැරණි හා අබලන් ජලනල තොග පවත්වාගැනීම හේතුවෙන් මණ්ඩලයේ ද්‍රවශීලතා ගැටළු මතුවී ඇත. තවද විධිමත් තොග පාලන හා පිරිවැය ගිණුම්කරණ ක්‍රමයක් නොපැවතීම හේතුවෙන් මණ්ඩලය සතු සම්පත් වලින් උපරිමව ප්‍රයෝජන ගැනීම අසීරු වී ඇත. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය කාර්යක්ෂම සේවා සපයන්නෙකු හා මූල්‍යමය ශක්‍යතාවයකින් යුතු ආයතනයක් බවට පත් කිරීම සඳහා පිරිවැය ගිණුම්කරණය ද ආවරණය වන පරිදි ආයතනික සම්පත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම, ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය විධිමත් කිරීම සඳහා මනා සම්බන්ධීකරණයකින් යුත් ප්‍රසම්පාදන පද්ධතියක් පිහිටුවීම වැදගත් වේ.

## 2.4 වරාය

ශ්‍රී ලංකාව එහි පිහිටීමේ වාසිය සම්පූර්ණයෙන්ම ලබා ගැනීම සඳහාත් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය සඳහා ගෝලීය නාවුක හා ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයක් ලෙසත් වරාය සංවර්ධනය කෙරෙහි රටෙහි ප්‍රතිපත්ති රාමුව තුල වැඩි අවධානයක් යොමුකර ඇත. ඉහත අරමුණු ළඟා කරගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කලාපීය ප්‍රතිනැව්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියත්, ආරම්භයේ දී සේවා සපයන හා කාර්මික වරායක් වශයෙනුත්, පසුව බහුකාර්ය වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස හා ප්‍රවර්ධනය

කිරීමත් අරමුණු කොට ගෙන මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ගොඩනැගීමේ ව්‍යාපෘතියත්, නාවුක මධ්‍යස්ථානයක් ලෙස ගාලු වරායත්, පරිසර හිතකාමී, විවේකී හා සරල නාවුක මධ්‍යස්ථානයක් ලෙස ත්‍රිකුණාමලය වරාය සංවර්ධන ව්‍යාපෘතියත් ආදී වූ යටිතල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවනු ලබයි. ශ්‍රී ලංකාවේ වරාය දම්වැලෙහි කොටස් ලෙස කලාපීය වාණිජ වරායන් ලෙස ඔලුවිල් හා කන්කසන්තුරේ වරායන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරයි. ඉහත ප්‍රතිපත්තීන් රජයේ මූලික ආයෝජන මූලෝපායන් ලෙස යොදා ගනිමින් 2005 - 2012 දක්වා රුපියල් මිලියන 74,650 ක් ආයෝජනය කර ඇත. වරාය මෙහෙයුම් අලෙවිකරණය පහසු කර ගැනීම සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ පලමු අදියරෙහි ව්‍යාපෘතීන් ලෙස මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ නව වරායත්, කොළඹ වරායේ නව පර්යන්ත තුනක් ඉදිකරමින් කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියත් ක්‍රියාත්මක කර ඇත. රාජ්‍ය - පෞද්ගලික අංශවල සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, වරායේ දිය කඩනයේ ඉදිකිරීම් සඳහා ආසියානු සංවර්ධන අරමුදලින් ලබාගත් ඇ.ඩො. මිලියන 300 ක් ඇතුලත්ව ඇ.ඩො. මිලියන 400 ක් වැය වේ. ඍජු විදේශ ආයෝජනයක් ලෙස ඇ.ඩො. මිලියන 500 ක වියදමින් ඉදිකරන ලද පළමු පර්යන්තයේ මෙහෙයුම් කටයුතු 2013 වසරේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

## 2.5 මගී ප්‍රවාහනය

ජනගහනයෙන් සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් තම ගමනාගමන කටයුතු සඳහා පොදු ප්‍රවාහන මාධ්‍යයන් භාවිතා කරනු ලැබේ. ඉන් සියයට 55 පමණ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ බස්රථ ගමනාගමනය මගින් සපුරාලනු ලබන අතර ශ්‍රී ලංකා දුම්රිය සේවය විසින් ඉතිරි සියයට 5 සපුරාලනු ලැබේ.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) 4,779 ක බස් ඇණියකින් යුතුව වෙලඳපොලින් සියයට 23 ක් පමණ ආවරණය කරනු ලබන අතර ඉතිරිය බස්රථ 19,699 ක ඇණියකින් යුතුව පෞද්ගලික අංශය විසින් ආවරණය කරනු ලබයි. 2012 දී ගාල්ල - කොළඹ දක්ෂිණ අධිවේගී මාර්ගය, පොළොන්නරුව - අම්පාර අධිවේගී මාර්ගය සහ ඇඹිලිපිටිය - කතරගම අධිවේගී මාර්ගය වැනි නව මාර්ගවල බස්රථ යොදවමින් ශ්‍රී ලංගම විසින් මාර්ග 3,200 ක බස් රථ ධාවනය කරනු ලැබේ. එසේම ශ්‍රී ලංගම, පෞද්ගලික අංශය විසින් ආකර්ෂණයක් නොදක්වන ග්‍රාමීය ප්‍රදේශවල සහ අනාර්ථික මාර්ගවල ද බස් රථ ධාවනය කරනු ලබයි.

ශ්‍රී ලංගමයේ 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ මෙහෙයවන ලද මගීන් සංඛ්‍යාව සියයට 1 කින් අඩු වුවද" මුළු ආදායමින් සියයට 90 ක් නියෝජනය කරන මාර්ග ලේඛන ආදායම 2011 වර්ෂයේදී රු. මිලියන 15,175 ක් වූ අතර එය 2012 වර්ෂයේදී රු. මිලියන 18,209 දක්වා සියයට 20 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි. මාර්ග ලේඛන ආදායමේ වර්ධනයට ප්‍රධානම හේතුව වනුයේ 2012 පෙබරවාරි මාසයේ සියයට 20 කින් බස් ගාස්තු වැඩිවීම වේ. පාසැල්, විශ්වවිද්‍යාල/තාක්ෂණ විද්‍යාල සිසුන් සඳහා පිළිවෙලින් සියයට 90 සහ සියයට 70 යන සහනදායී අනුපාතයන්ට වාර ප්‍රවේශපත්‍ර ලබා දීමත්, අනාර්ථික මාර්ගයන්හි බස් රථ ධාවනය කරවීමත් ශ්‍රී ලංගමය විසින් සිදුකරනු ලබන අතර ඒ සඳහා රු. මිලියන 3,750 ක් 2012 වර්ෂයේදී අයවැය මඟින් වෙන් කර තිබුණි.

2011 වර්ෂයේදී රු. මිලියන 24,126 ක් වූ මුළු වියදම 2012 වර්ෂයේදී රු. මිලියන 30,137 දක්වා වර්ධනය වී ඇත. ශ්‍රී ලංගමයේ වැඩිම වියදම් අයිතමය වන ඉන්ධන වියදම 2011 දී රු. මිලියන 7,797 ක් වූ අතර එය 2012 දී රු.

මිලියන 11,406 ක් දක්වා සියයට 46 කින් වර්ධනය වී ඇත. 2011 දී රු. මිලියන 10,167 ක්වූ කාර්ය මණ්ඩල පිරිවැය, 2012 මාර්තු මාසයේදී සේවකයෙකුගේ අවම වැටුප රු. 8,430 සිට රු. 11,730 දක්වා සියයට 39 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2012 දී රු. මිලියන 13,224 ක් දක්වා වැඩි වී ඇත. 2011 දී 34,263 ක් වූ ශ්‍රී ලංගමයේ සේවක සංඛ්‍යාව 2012 වර්ෂයේදී 33,806 දක්වා සියයට 1 කින් අඩු වී ඇත. විධිමත් සැලැස්මක් නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංගමයේ බස් රථ ඇණිය පුනරුත්ථාපනය කිරීම සඳහා වන වැඩසටහන යටතේ අයවැය මගින් වෙන් කර තිබූ රු. මිලියන 820 න්, රු. මිලියන 561 ක් පමණක් ප්‍රයෝජනයට ගෙන ඇත. 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංගම විසින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා බස් රථ 12 ක් යොදවා තිබූ අතර අතින් මිලදී ගත් බස් රථ 267 ක් හා සම්පූර්ණයෙන් අළුත්වැඩියා කරන ලද බස් රථ 306 ක් සමඟ 2012 වර්ෂය අවසාන වන විට 4,779 ක බස්රථ ඇණියක් පවත්වා ගෙන යාමට ශ්‍රී ලංගමයට හැකි විය.

දූඩි මූල්‍ය අර්බුදය හේතුවෙන් මණ්ඩලයට ව්‍යවස්ථාපිත ගෙවීම් කිරිමට නොහැකි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 1,700 ක අධිභාරයක් ගෙවීමට සිදුවී ඇත. 2012 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ස්වයං මූල්‍යනයට ළඟා වීම පිණිස ශ්‍රී ලංගම ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්මක් පිළියෙල කරමින් පවතී. 2013-2015 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංගම රු. මිලියන 4,840 ක් ආයෝජනය කර බස් රථ 1,400 ක් එක් කරමින් ධාවන බස් රථ ඇණිය ප්‍රතිෂ්ඨාපනය කිරිමට කටයුතු සැලසුම් කර ඇත. කෙසේ වුවද, ශ්‍රී ලංගමය සතුව ප්‍රමාණවත් සංචිත නොමැති වීම නිසා, එහි සේවාව පුළුල් කිරීම හා බස් රථ පුනරුත්ථාපනය කිරීම නිසි ශක්‍යතාවයකින් යුතුව සිදු කළ යුතුය.

## 2.6 ගුවන් සේවා

ගුවන් සේවා අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ පහසුකම් විධිමත් කිරීම පිණිස ගුවන් සේවා දෙකෙහි ව්‍යාපාරික කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම රජයේ ප්‍රමුඛ කාර්යයක් වේ. ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ මිහින් ලංකා ගුවන් සමාගම රජයේ ගුවන් සේවාවන් දෙකක් ලෙස ක්‍රියාත්මක වන අතර ගුවන්තොටුපල හා ගුවන් සේවා සමාගම සිය ගුවන් සමාගම් වෙනුවෙන් යටිතල පහසුකම් හා අනුබද්ධිත සේවාවන් සපයයි. 2005-2012 කාලය තුළ රු. මිලියන 32,170 ක මුදලක් මෙම අංශය වෙත ආයෝජනය කරන ලද අතර, 2013-2015 කාලයේ දී මෙම අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් තවත් රු. මිලියන 40,996 ක් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇත. ගුවන් සේවාවන් දෙක එකිනෙකට අනුපූරකයන් වෙමින් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම සහ ගුවන් යානා ඇණිය පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ජාත්‍යන්තර ගුවන් ගමන් සංගමය විසින් ආසියා පැසිපික් කලාපයේ ගුවන් මගී තදබදය සියයට 6.7 ක් වූ සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතයකින් වර්ධනය වන බවත්, 2011 දී සමස්ත ලෝක ගුවන් මගීන්ගෙන් සියයට 29 ක් ආසියා පැසිෆික් කලාපය නියෝජනය කළ ද 2016 වන විට එම ප්‍රමාණය සියයට 33 ක් දක්වා වර්ධනය වන බවත් දක්වා ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ගුවන් භාණ්ඩ ප්‍රවාහන වෙළඳපල සියයට 8.7 කින් වාර්ෂිකව වර්ධනය වන බවත් සිය ශ්‍රේණිගත කිරීම් අනුව 2011/2016 තුළ වේගවත්ව වර්ධනය වන ගුවන් භාණ්ඩ ප්‍රවාහන වෙළඳපල පහ අතුරින් පළමු ස්ථානය ශ්‍රී ලංකාවට හිමිවන බවත් වැඩි දුරටත් හඳුනාගෙන ඇත. එබැවින් ගුවන් සේවා අංශයේ සිදු කළ ආයෝජනයන් සඳහා මධ්‍ය කාලීනව ධනාත්මක ප්‍රතිඵල අපේක්ෂා කළ හැකි බව පෙනේ.

2012 වර්ෂයේ දී සිදු වූ ගෝලීය මූල්‍ය අර්බුදයට සමගාමීව ඉන්ධන මිල අධිකව ඉහළ යාමෙන් ගුවන් සේවා කර්මාන්තයට සැලකිය යුතු අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී තිබේ. ලාභාන්තිකයේ සැළකිය යුතු අඩු වීමක්

දක්නට ලැබුණද මෙම අභියෝගයන් ශ්‍රී ලංකන් ගුවන් සේවය හා මිහින් ලංකා ගුවන් සේවය සඳහා පමණක් විශේෂ නොවන අතර ශ්‍රී ලංකාව වඩා ජනප්‍රිය සංචාරක පුරවරයක් ලෙසට ඇති ඉල්ලුමේ වර්ධනයද ගුවන් මගීන් සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ ඉහළ යාමද නිසා ගුවන් සේවා සමාගම් දෙකෙහි ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ඇති වන වර්ධනයද තුලින් ආසියානු වෙළඳපොළෙහි ශක්තිමත්ව පෙනී සිටීමට හැකියාව ලැබෙනු ඇත. ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම මගින් මෙරට ජාත්‍යන්තර ගුවන් තොටුපල දෙකෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් සමග යුරෝපය සහ ඈත පෙරදිග රටවල් සමග ඇති ගුවන් සේවා ජාලය ශක්තිමත් කිරීම තුලින් මධ්‍ය කාලීන වශයෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගමට හා මිහින් ලංකා සමාගමට සිය කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට අවස්ථාවක් සැලසෙනු ඇත. සංචාරක, අපනයනය, වෙළඳ හා ගුවන් සේවා කර්මාන්තය පදනම් වූ සේවාවන් තුළින් රටේ ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම මෙන්ම මෙම ආයතනවල වාණිජමය ලාභදායිත්වයේ ද ප්‍රධාන සාධකය වනුයේ ගුවන් සේවා කර්මාන්තයය.

## 2.7 ඉදිකිරීම් අංශය

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සහ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව ඉදිකිරීම් අංශයේ නියැලෙන රාජ්‍ය ආයතන තුන වේ. ඉදිකිරීම් ක්ෂේත්‍රය ද.දේ.නිෂ්පාදිතයට 2012 වර්ෂයේ දී සියයට 8 දායකත්වයක් ලබා දී ඇති අතර එය 2011 වර්ෂයට සාපේක්ෂව සියයට 22 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි. ගෝලීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියයට 10 ක වර්ධනයක් අපේක්ෂා කරන අතර එය දේශීය හා විදේශීය වශයෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන ආයතන වලට ව්‍යාප්ත වීමට මනා ඉඩ ප්‍රස්ථාවක් සලසනු ලබයි. රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු වලින් සියයට 90 ක් පමණ මෙම ආයතනවලින් සිදු කරන අතර 2012 වර්ෂයේ දී රු. බිලියන 21.5 ක පමණ රජයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු මෙම ආයතනවලින් සිදු කර ඇත. කෙසේ වුවද, ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳව සලකා බැලීමේදී මෙම ආයතන තුනෙහි පිරිවැටුම සියයට 0.7 ක පමණ අගයක් ගනී.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉංජිනේරුමය කාර්යයන් පිළබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සහ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව සඳහා ඇ.ඩො. මිලියන 108 ක පමණ නවීන යන්ත්‍රෝපකරණ ලබාදෙනු ලැබුවද මෙම ආයතන තුනෙහි කාර්යසාධනයෙහි බොහෝ දුර්වලතා දැකිය හැකිය. රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදයන් සිදු වීමට හේතුව වනුයේ මෙම ආයතන හැකියාවන් ඉක්මවූ කාර්යයන්හි නියැලීම වන අතර ඒ හේතුවෙන් වියදම මෙන්ම කාලයද නාස්තිවීමක් සිදු වේ.

මෙම ආයතනයන් මුහුණදෙන ද්‍රවශීලතා ගැටළු නිසා නවීන යන්ත්‍ර සහ උපකරණ වෙනුවෙන් ප්‍රමාණවත් ආයෝජන අවස්ථා අහිමි වන අතර ඒ තුළින් ආයතනවල හැකියා වර්ධනය මෙන්ම ඵලදායකත්වයද දුර්වල වේ. එලෙසම නිපුණතාවයකින් යුතු වෘත්තිකයන් ආකර්ෂණයකර ගැනීම මෙන්ම රඳවා තබා ගැනීමේ ගැටළුව ද මෙම ආයතන තුනම මුහුණදී තිබේ. දේශීය මෙන්ම විදේශීය ඉදිකිරීම් වෙළඳපල තුළ වර්ධනයත් සමග වෘත්තිකයින් සඳහා රාජ්‍ය ආයතන ලබා දෙන වැටුපට වඩා බොහෝ ඉහළ වැටුප් පෞද්ගලික අංශය මගින් ලබා දීම මෙයට මූලික හේතුවයි. ව්‍යාපෘති ව්‍යුහයන් ප්‍රතිව්‍යුහගත කිරීම, පෞද්ගලික අංශයේ ඉදිකිරීම් සඳහා ඇති දායකත්වය ඉහළ නැංවීම, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශය සමග උප කොන්ත්‍රාත් ඇති කර ගැනීම, වෘත්තිකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වඩා ඉහළ දිරිගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණ

කටයුතු වාණිජමය ආකාරයකින් කරගෙන යාම වැනි ක්‍රියාමාර්ග තුළින් මෙම ආයතන තුනෙහි ඇති හැකියාවන් සම්පූර්ණ වශයෙන් උපයෝජනය කිරීම සිදු කළ හැක.

## 2.8 රාජ්‍ය බැංකු

රජයට අයත් බැංකු 8 රටපුරා ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 56 ක් ඇරඹීම තුළින් ශාඛා ජාලය ශාඛා 1,580 ක් දක්වා වර්ධනය කර ගනිමින් තම මෙහෙයුම් පුළුල් කර ඇත. ගැටුම් පැවති දිස්ත්‍රික්කවල ශාඛා 20 ක් විවෘත කර ඇත. මූල්‍ය සේවා සඳහා පහසුවෙන් ලඟා වීමේ හැකියාව පෙන්නුම් කරමින් රාජ්‍ය බැංකු 2005 දී පුද්ගලයන් 10,000 ට බැංකු ශාඛා 3 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 1 සිට 2012 ද බැංකු ශාඛා 11 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 12 දක්වා ජන විකාශය මත සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වීමේ වර්ධනයක් පෙන්නුම් කරමින් 2005 දී වර්ග කිලෝ මීටර 1,000 ට බැංකු ශාඛා 9 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 0.5 සිට 2012 දී බැංකු ශාඛා 34 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 36 ක් දක්වා වැඩි වී ඇත. ආර්ථික වර්ධනයේ ප්‍රධාන හේතු කාරකයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හඳුනාගනිමින් 2012 අයවැය යෝජනාවට අනුව විශේෂ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකු ශාඛා 37 ක් සියළුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි පිහිටුවන ලදී.

සමස්ත බැංකු අංශයේ ආදායම් වර්ධනය වන සියයට 22 ඉක්මවමින් රජයේ බැංකු 2012 වර්ෂය තුළ සියයට 31 ක වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් වර්ෂය තුල සාමාන්‍ය පොලී අනුපාත ඉහළ යාමත් සමඟ 2011 ට සාපේක්ෂව ආන්තිකයන් සියයට 10 සිට 8.8 දක්වා අඩුවී ඇත. තැන්පත්කරුවන්ට සහ අරමුදල් රැස්කිරීමේදී බැංකු සඳහා ණය දෙන්නන් වෙනුවෙන් ප්‍රදානය කළ ඉහළ පොලී අනුපාත හේතුවෙන් බැංකු පොලී වියදම 2011 දී රු. බිලියන 102.8 ට සාපේක්ෂව 2012 දී රු. බිලියන 158 ක් දක්වා සියයට 54 ක ඉහළ යාමක් සිදු වී ඇත.

2012 දී රජයේ බැංකු 8 විසින් සමස්ත බැංකු අංශයේ මුළු වත්කම් පදනමෙන් සියයට 50 කට සහ මුළු තැන්පතු වලින් සියයට 52 කට දායකත්වය ලබාදී ඇත. රාජ්‍ය ව්‍යවසායයන්ට ණය ලබාදීම් වැඩිවීමේ මූලික හේතුවෙන් රජයේ බැංකු 2011 දී සියයට 18 ක වත්කම් මූලික වර්ධනයට සාපේක්ෂව 2012 දී සියයට 23 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර මෙය සමස්ත බැංකු අංශයේ වත්කම් වර්ධනය වන සියයට 20 ඉක්මවා යාමකි. රු. බිලියන 2,431 ක් වන ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වත්කම් ප්‍රමාණය සමස්ත බැංකු අංශයේ වත්කම් වලින් සියයට 46 කට දායකත්වය ලබාදී ඇත. රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධන අරමුදල 2012 දී රු. බිලියන 123 ක් වූ අතර එය 2011 වසර සමඟ සැසඳීමේදී සියයට 17.6 ක සුවිශේෂී වර්ධනයකි. සමස්ත බැංකු අංශයේ ප්‍රාග්ධන අරමුදල 2012 දී සියයට 18 ක වැඩිවීමක් වාර්තා කර ඇත.

වසරින් වසර වර්ධනය සියයට 16 ක් බවට පත්කරමින් රජයේ බැංකුවල තැන්පතු පදනම 2012 වසර අග වන විට රු. බිලියන 1,888 ක් දක්වා වැඩිවී ඇත. කෙසේ වෙතත් රජයේ බැංකුවල තැන්පතු වර්ධනය 2012 දී සමස්ථ බැංකු අංශයේ තැන්පතු වර්ධනය වන සියයට 17 ට වඩා අඩු අගයක් වේ. ණය වර්ධනය මත සීමා පැනවීම් තිබියදීත්, සමස්ථ බැංකු අංශයේ ණය සහ අත්තිකාරම් වර්ධන අනුපාතය වන සියයට 21 ට එරෙහිව රජයේ බැංකු සියයට 25.8 ක වර්ධනයක් වාර්තා කර ඇත.

2012 දී පැවති ඉහළ පොලී අනුපාත තත්ත්වය බැංකු මෙහෙයුම් කටයුතු සඳහා අභියෝග කරන බව තහවුරු වේ. මුළු අක්‍රීය ණය ශේෂය වන රු. බිලියන 55.3 හි සියයට 28 ක් නැතහොත් රු. බිලියන 12.2 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. අක්‍රිය ණය ශේෂ අනුපාතය 2011 දී සියයට 4 සිට 2012 දී සියයට 4.1 දක්වා වැඩිවී ඇති අතර මෙය 2012 දී සමස්ත බැංකු අංශයේ අක්‍රිය ණය ශේෂ අනුපාතය වන සියයට 3.6 ට වඩා වැඩි අගයක් විය.

2012-14 සඳහා වන තුන් අවුරුදු සාමුහික ගිවිසුම හේතුවෙන් පුද්ගල පිරිවැය 2011 ට සාපේක්ෂව 2012 දී රු. බිලියන 34.4 කට, සියයට 23 කින් නැතහොත් රු. බිලියන 6.5 කින් වැඩිවී ඇත. රාජ්‍ය ව්‍යවසායයන්ට ණය දීම තුලින් වන ඉපැයීම් මත විශ්වාසය තැබීමද අවදානමකි. රාජ්‍ය බැංකුවල මුළු ණය කළඹින් සියයට 29 ක් එනම් රු. බිලියන 460 ක් උකස් සේවා වන අතර 2012 දී ජාත්‍යන්තර රන් මිල ගණන් සියයට 3.6 කින් පහල යෑම උපායශීලී ලෙස කළමනාකරණය නොකලහොත් බැංකුවලට ඉදරියට ගෙන යන ණය ශේෂයන්හි සැලකිය යුතු අගය පහල වැටීමක් සිදු විය හැක. එමෙන්ම නිවාස සහ වෙළඳ ක්ෂේත්‍රයන්ට ලබාදෙන ණය ඉහළ යෑම සම්බන්ධයෙන් දැඩි අධීක්ෂණයක් සහ ව්‍යාපාර සැලසුම් කිරීමක් සිදු කල යුතුය.

## 2.9 රක්ෂණය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් දේශීය රක්ෂණ සමාගම් 16 ක් සහ විදේශීය රක්ෂණ සමාගම් 6 කින් සමන්විත සමාගම් 22 ක් සම්බන්ධයෙන් නියාමන කටයුතු වල නිරතවී සිටී. රාජ්‍ය ව්‍යවසායන් වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ජාතික රක්ෂණභාර අරමුදල, කෘෂි රක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලය යන රක්ෂණ ආයතන විසින් රාජ්‍ය අංශයේ රක්ෂණ ක්ෂේත්‍රය නියෝජනය කරයි.

රක්ෂණ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන දායකත්වයක් දරන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සාමාන්‍ය රක්ෂණය අතුරින් සියයට 24 ක වෙළඳපොල කොටසක් සහ සියයට 19 ක ජීවිත රක්ෂණ වෙළඳපොළ කොටසක් ද 2012 වර්ෂයේදී ආවරණය කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රතිරක්ෂණ කටයුතු වල නිරතව සිටින අතර රජයේ සේවකයන් සඳහා ක්‍රියාත්මක වන අග්‍රහාර රක්ෂණය ද කළමනාකරණය කරනු ලබයි. ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සාමාන්‍ය රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කර ඇති අතර 2009 වර්ෂයේ වාර්තා කල රු. මිලියන 35,101 ක දළ වාර්ෂික ආදායම 2012 දී රු. මිලියන 53,297 ක් දක්වා වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදල 2009 වර්ෂයට සාපේක්ෂව සියයට 27.6 ක රක්ෂණ කර්මාන්තයේ සාමාන්‍ය වර්ධන වේගය ඉක්මවූ වර්ධන අනුපාතයක් දක්වා ලඟාවීමට සමත්වී ඇත. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 174 ක් වන අතර මෙම ආයතනය අපනයනකරුවන් සුළු ප්‍රමාණයකට රක්ෂණ පහසුකම් සපයනු ලබයි.

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම රක්ෂණ කර්මාන්තයේ නිරතවී සිටින සමාගම් වල ප්‍රමුඛතාවයක් ලබාදෙන ආයෝජන මූලාශ්‍රයක් වන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් තම මුළු ආයෝජන වලින් සියයට 38.4ක ප්‍රමාණයක් වන රු. බිලියන 30ක් රාජ්‍ය සුරැකුම් පත්වල ආයෝජනය කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය රු.බිලියන 4.3 කි.
මිලියන 8.5ක් වන මුළු ශ්‍රම බලකායෙන් මිලියන 1ක් පමණ නියෝජනය කරනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන් විශ්‍රාම වැටුප් ලබා ගැනීමට හිමිකම් දරණ අතර තම දායකත්වය මත අග්‍රහාර රක්ෂණ ක්‍රමය මගින්

ලැබෙන වෛද්‍ය රක්ෂණ පහසුකම් ද ලබා ගනියි. වාර්ෂික අයවැයෙන් ඉතා විශාල ප්‍රමාණයක් වෙන්කරනු ලබන සෞඛ්‍ය සේවා සහ සුභ සාධක සේවා රට තුල පැවතුන ද රක්ෂණ කර්මාන්තයට මධ්‍යකාලීනව වර්ධනය වීමේ වැදගත් අවස්ථා රට තුල පවතී. රටේ සාර්ව ආර්ථික දැක්ම අනුව වර්ධනය වන වැයකල හැකි ආදායමට අනුව සාමාන්‍ය රක්ෂණ කටයුතු වලට මෙන්ම වාහන රක්ෂණ, ගිනි රක්ෂණ වැනි ක්ෂේත්‍ර වලට වර්ධනයවීමේ අවස්ථා පුළුල් වී ඇත.

## 2.10 ලොතරැයි

ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය සාමාන්‍ය සහ ක්ෂණික ලොතරැයි නිකුත් කරමින් වෙළඳපොලෙහි ක්‍රියාත්මක වේ. ජාතික ලොතරැයි මණ්ඩලයේ 2012 අග වන විට නිෂ්පාදන කළඹෙහි සාමාන්‍ය ලොතරැයි 7 ක් හා ක්ෂණික ලොතරැයි වර්ග 2 ක් වූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍ය ලොතරැයි 6 ක් සහ ක්ෂණික ලොතරැයි 3 ක් විය. 2012 අග වන විට වෙළඳපොලෙන් සියයට 55 ක් ජාතික ලොතරැයි මණ්ඩලයට හිමිවූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉතිරි සියයට 45 දරයි. මෙම ආයතන 2 දැඩි ප්‍රචාරක සහ අලෙවිකරණ වැඩසටහන් මඟින් එකිනෙකා සමඟ තරඟ කරයි. 2012 වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රචාරණය සහ අලෙවිකරණය සඳහා රු. මිලියන 1,112 ක් දරා ඇති අතර එය 2011 ට වඩා රු. මිලියන 290 හෝ සියයට 35ක වැඩිවීමකි. ප්‍රචාරණ සහ අලෙවිකරණ වියදම මුළු වියදමෙන් සියයට 55 ක් වේ.

කර්මාන්තයේ මුළු වත්කම් 2011 දී වූ රු. මිලියන 4,578 සිට 2012 දී රු. මිලියන 4,813 දක්වා සියයට 5 ක වර්ධනයක් වාර්තා කරයි. කර්මාන්තයේ ආදායම 2011 ට සාපේක්ෂව රු. මිලියන 3,820 කින් වැඩිවී 2012 දී රු. මිලියන 20,452 දක්වා සියයට 23 ක වර්ධනයක් වාර්තා කර ඇත. ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි ටිකට්පත් මිලියන 916 ක් අලෙවි කර ඇති අතර ප්‍රකාශයට පත් කර ඇති ත්‍යාග වල වටිනාකම 2011 දී රු. මිලියන 8,978 ක් වූ අතර 2012 දී රු. මිලියන 10,682 ක් විය. ජාතික ලොතරැයි මණ්ඩලය ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 2,276 කින් දායක වී ඇති අතර එය 2011 දී දායක වූ අගයට වඩා සියයට 69 ක වැඩිවීමක් වේ. එසේම සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට ලබාදී ඇති දායකත්වය සියයට 18 කින් වැඩිකිරීමෙන් රු. මිලියන 253 කින් ඉහළ දමා මුළු දායකත්වය රු. මිලියන 1,648 දක්වා වැඩි කර ඇත. ඒකපුද්ගල ආදායමෙහි පුරෝකථනය කර ඇති වර්ධනයත් සමඟම ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙනස්වන ආදායම සහ ජනසංයුතියට මුහුණ දිය හැකි නිෂ්පාදන හඳුන්වාදිය යුතු වේ. අන්තර්ජාලය, කෙටි පණිවිඩ ක්‍රමය වැනි තාක්ෂණික ක්‍රම භාවිතය ජාතික ලොතරැයි මණ්ඩලයට සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයට වෙළඳපොලට කාර්යක්ෂම ලෙස කිඳා බැසීමට පහසුකම් සලසයි.

## 2.11 පශු සම්පත

පශු සම්පත් නිෂ්පාදන ආනයන වාර්ෂිකව ඇ.ඩො. මිලියන 400 ක මට්ටමක පවත්වා ගනිමින් රටේ පශු සම්පත් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ රජයේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස මෑත වර්ෂවල පශු සම්පත් කර්මාන්තයේ ඇතිවූ වෙළඳපල විතැන් වීමත් සමඟම රජය සතු ව්‍යාපාර 2 ක් වන මිල්කෝ සමාගම සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2012 වර්ෂයේ දී සිය කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 15 කින් වැඩි කිරීමටත් මුළු කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 72 දක්වා වර්ධනය කිරීමටත් සමත් වී ඇත. පුද්ගලික අංශයේ බහු ජාතික සමාගම් සීමිත සංඛ්‍යාවක් කිරිපිටි ආනයනයේ යෙදී සිටින අතර මහා පරිමාණ ව්‍යාපාර 3 ක් සුළු හා මධ්‍ය පරිමාණ

කර්මාන්ත සහ කිරි ගොවීන් 400,000 ක් පමණ දේශීය පශු සම්පත් කර්මාන්තයේ නියැලී සිටී. පුද්ගලික අංශය විසින් සිදු කළ 2011 වර්ෂයේ පැවති ලී. මිලියන 201 ක් වූ කිරි නිෂ්පාදනය 2012 වසර වන විට ලී. මිලියන 227 ක් දක්වා ලී. මිලියන 26 කින් වැඩිවී ඇත.

2012 වසරේදී කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟාවීමේ ප්‍රතිපත්තියට අනුව රජය විසින් මධ්‍යකාලීනව කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමත්, කිරි ගොවි කර්මාන්තය සමඟ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා කුඩා ගොවීන් අතර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව රු. මිලියන 624 ක් වැයකර කිරි එළදෙනුන් 2,000 ක් ආනයනය කර ඇත.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ මිල්කෝ සමාගම කිරි සැපයුම් කර්මාන්තයේ දැඩි තරඟකාරීත්වයකින් යුක්තව නියැලි සිටී. වර්තමානයේ කර්මාන්තයේ ආධිපත්‍ය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සතුව පවතී. එහෙයින් කිරි නිෂ්පාදනය අශ්‍රිත ක්‍රියාවලිය සෞඛ්‍යාරක්ෂිත නොවන සහ ආර්ථිකමය නොවන භාවිතයන්, ගබඩා කිරීමේ සහ වෙළෙඳපොළ සොයාගැනීමේ ගැටළු සම්බන්ධව ජාතික පශු සම්පත් මණ්ඩලය සතු දැනුම මෙන්ම ආයතනය සතු සම්පත් භුවමාරු කිරීම අවශ්‍ය වන අතර එමගින් පවතින වෙළෙඳපොල ඉල්ලුම වැඩි කර ගත හැක. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ මිල්කෝ සමාගම තම තරඟකාරී පරිසරය පුළුල් කිරීම තුළින් මෙම තත්ත්වය සඳහා විසඳුම් සොයා ගත හැකිවනු ඇත.

## 2.12 වැවිලි අංශය

2004 වසරට පෙර වැවිලි කර්මාන්තය පුද්ගලීකරණය කිරීමෙන් පසුව ඉතිරි වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම), ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (ශ්‍රී.ල.රා.වැ.ස.), හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම, ඇල්කඩුව වැවිලි සමාගම සහ කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව තවදුරටත් රජයේ පූර්ණ හිමිකම සහිත වැවිලි ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන ලදී.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ඇල්කඩුව වැවිලි සමාගම පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර 11,695, 11,757 හා 4,083 සහිතව මූලික වශයෙන් තේ සහ රබර් වගාවන්හි නිරත වෙයි. පොල් සංවර්ධන මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, හලාවත වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම ඉඩම් හෙක්ටයාර 9,303 ක් කළමනාකරණය කරමින් පොල් හා වෙනත් සුළු භෝග වගාවන්හි නිරත වනු ලබයි.

2012 වසරේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම සහ කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව යන ආයතන වල තේ නිෂ්පාදනය කිලෝ මිලියන 8.6 වූ අතර එය 2011 වසරට සාපේක්ෂව සියයට 3.5 ක වැඩිවීමකි. මෙම ආයතන සතු තේ ඉඩම් ප්‍රමාණය, රටේ සමස්ථ තේ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 11.5 ක් වුවද, එම ආයතන වල තේ නිෂ්පාදනය රටේ සමස්ථ තේ නිෂ්පාදනයෙන් සියයට 2.5 ක් පමණක් විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම සහ කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව යන ආයතනයන්හි වාර්ෂික තේ එලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 337 වූ අතර එය රටේ සාමාන්‍ය තේ එලදාව වූ කිලෝග්‍රෑම් 1,400 හා සසඳන කල සියයට 76 ක පසුබෑමකි. මෙම තත්ත්වය තුලින් එම ආයතනවල ධාරිතා උපයෝජනයේ සැලකිය යුතු පහල යාමක් පෙන්නුම් කරයි.

2012 වසරේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා කුරුණෑගල වැවිලි සමාගම යන ආයතන වල මුළු රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 45,900 ක් වූ අතර එය 2011 වසර හා සසඳන කල සියයට 15 ක අඩුවීමකි. මෙම ආයතන සතු රබර් ඉඩම් ප්‍රමාණය රටේ සමස්ථ රබර් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 0.74 වුවද, එම ආයතන වල රබර් නිෂ්පාදනය රටේ සමස්ථ රබර් නිෂ්පාදනයෙන් සියයට 0.3 ක් පමණක් විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා කුරුණෑගල වැවිලි සමාගම යන ආයතනයන්හි වාර්ෂික රබර් ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 463 ක් වූ අතර එය රටේ සාමාන්‍ය රබර් ඵලදාව වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,607 හා සසඳන කල සියයට 71 ක පසුබෑමකි. මෙම තත්ත්වය මෙම ආයතනවල පූර්ණ ප්‍රතිව්‍යුහගතකරණයක අවශ්‍යතාවය නිරූපණය කරන්නකි.

පොල් සංවර්ධන මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, හලාවත වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම ඉඩම් හෙක්ටයාර 9,303 ක් කළමනාකරණය කරමින් එනම් රටේ පොල් වගාව සඳහා යොදවා ඇති සමස්ථ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 2.3 ක් කළමණාකරණය කරමින් පොල් ගෙඩි මිලියන 44.7 ක් නිපදවා ඇත. එය 2011 වසර හා සසඳන කල සියයට 6.7 ක වර්ධනයක් වන අතර එය රටේ සමස්ථ පොල් නිෂ්පාදනයට කල දායකත්වය සියයට 1.5 කි. රටේ සමස්ථ වැවිලි අංශයේ ඵලදායකත්වය හා සසඳන කල ජනවසම, ශ්‍රී.ලං.රා.වැ.ස. හා ඇල්කඩුව වැවිලි සමාගම්වල ඵලදායීතාවයේ පහල මට්ටමක් පෙන්නුම් කරයි. ඉඩම් භාවිතය, නැවත වගාකිරීම, පොහොර භාවිතය, නවීන යන්ත්‍රසූත්‍ර සඳහා ප්‍රමාණාත්මක නොවන ආයෝජනයන් මෙන්ම ශ්‍රමසූක්ෂම තාක්ෂණික උපක්‍රම භාවිතා කිරීමේදී අවශ්‍ය පුහුණු ශ්‍රමයේ හිඟකම යනාදී ව්‍යුහාත්මක ගැටළු සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේද හා ක්‍රියාපටිපාටිවල දුර්වලතා වලකා ගැනීමට නොහැකිවීම මීට පාදක වී ඇත.

ජනවසම, ශ්‍රී.ලං.රා.වැ.ස. සහ ඇල්කඩුව වැවිලි සමාගම් දිගින් දිගටම අලාභ ලැබීම තුළින් ඒවා අඩු ඵලදායීතාවයකින් යුතුව ක්‍රියාත්මක වන බව පෙන්නුම් කරන අතර කාර්යසාධනය හා බැඳුනු වැටුප් ව්‍යුහයක් වෙනුවට වැවිලි ක්ෂේත්‍රයේ භාවිතවන ස්ථිර දෛනික වැටුප් ව්‍යුහය ද මෙම ආයතනවල ඵලදායිතාවය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කර ඇත. ඉහළ යන වැටුප් පිරිවැය, ප්‍රමාණවත් නොවන නැවත වගාව, තාක්ෂණික ක්‍රම යොදාගැනීම සහ කළමනාකරණ අකාර්යක්ෂමතා වැවිලි ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතන මුහුණදී ඇති අභියෝගයන්ය. මෙම තත්ත්වය එම ආයතන විසින් කලයුතු ව්‍යවස්ථාපිත ගෙවීම් පවා නියමිත දිනට සිදු කිරීමට නොහැකි තත්ත්වයකට පත් කර ඇත. ජනවසම, ශ්‍රී.ල.රා.වැ.ස සහ ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනවල දිගුකාලීනව නොසලකාහැරීම මත ඇති වී ඇති නිසරු බිම් හා අඩු ආයෝජන හේතුවෙන් මෙම ආයතන සඳහා අවම වශයෙන් රු. බිලියන 2 ක වත් මධ්‍යකාලීන ආයෝජනයක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, සිය අරමුදල් හිඟබව සහ දුර්වල ශේෂපත්‍රයන් ප්‍රතිව්‍යුහගතකරණයට ඇති සීමිත නිදහස නිසා නැවත වගා කිරීම, පොහොර යෙදීම ආදිය තුලින් එම ආයතනයන්හි ඵලදායිත්වය ඉහළ නංවා ගැනීමට අපහසුවීමෙන් මෙම ආයතනවලට ඔවුන් මුහුණදී ඇති විෂම චක්‍රය තුල නැවතත් සිරවීමට සිදු වී ඇත.

රජයට පවරන ලද වත්කම් ලබාගෙන සීනි කර්මාන්තයේ පුනරුදයක් ඇති කිරීමට ලංකා සීනි සමාගම අළුතින් ඇතිකරන ලද අතර කුඩා ඉඩම් හිමියන් 12,000 ක් ආවරණය කරමින් උක් හා ඒ ආශ්‍රිත කර්මාන්ත පුළුල් කිරීම සඳහා කර්මාන්තශාලා නවීකරණය කිරීම හා එමගින් එම සමාගම සම්පූර්ණ වාණිජ සමාගමක් බවට පත්කිරීමටත් 2012 දී කටයුතු කරන ලදී. ව්‍යාපාර මෙහෙයුම් ඒකාබද්ධ කිරීම සඳහා කන්තලේ සහ හිඟුරාණ උක් වගාවන් සහ නිෂ්පාදන ක්‍රියාවලිය මෙම සමාගමට පවරා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 2.13 සෞඛ්‍ය

උසස් ප්‍රමිතියෙන් යුත් ඖෂධ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට සැපයීම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ ඖෂධ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව විසිනි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව ඖෂධ වර්ග 60 ක් පමණ නිෂ්පාදනය කරන අතර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හස්තය ලෙසින් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සංස්ථාව රටට අවශ්‍ය ආයුර්වේදීය ඖෂධ පර්යේෂණයන් සිදු කරන අතරම සිය නිෂ්පාදන, රෝහල් වෙත සැපයීම සිදු කරනු ලබයි. රජයට අයත් රෝහල්වලින් ගාස්තුවක් අය කරනු ලබන එකම රෝහල ශ්‍රී ජයවර්ධනපුර රෝහල වන අතර එය රටේ පුළුල් වූ පරාසයක් ආවරණය කරනු ලබන සායනික හා අතුරු සායනික සේවාවන් සපයනු ලබයි. ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ වෛද්‍ය සිසුන් හා හෙදියන් පුහුණු කිරීමේ ශික්ෂණ රෝහලක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර රෝහල සුවිශේෂ සේවාවක් ඉටු කරනු ලබයි.

## 2.14 මාධ්‍ය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනී ජාලය අප රටේ මාධ්‍ය කර්මාන්තයේ සියයට 32 ක වෙළඳපොළ කොටස් හිමිකර ගනිමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාවාසී සියළුම ජාතීන්ට සමාන පහසුකම් සැපයීමේ රජයේ ප්‍රතිපත්තියට සමගාමීව රාජ්‍ය මාධ්‍ය ආයතන භාෂා ත්‍රිත්වයෙන්ම නව නාලිකා හඳුන්වා දෙමින් පෞද්ගලික අංශයේ රූපවාහිනී නාලිකා 18 ක් සහ ගුවන් විදුලි නාලිකා 39 ක් සමග තරග වදියි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, සහ ස්වාධීන රූපවාහිනී ජාලය නව ආදායම් ප්‍රවාහයන් අත්පත්කර ගැනීමෙන් ඔවුන්ගේ මෙහෙයුම් පුළුල් කර ගැනීමට හැකි වී තිබේ. එසේ වුවත්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව පෙර සේම ජාතික අයවැය තුලින් අනුග්‍රහය ලබයි. රාජ්‍ය මාධ්‍ය ආයතන වලින් සාපේක්ෂ වශයෙන් ස්ථාවර මූල්‍ය තත්වයක් පවතින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, සහ ස්වාධීන රූපවාහිනී ජාලයේ පහසුකම් වර්ධනය කිරීමේ සහ උපකරණ මිලදී ගැනීමේ ආයෝජන වැඩසටහනක් ඉදිරි තුන් වසරක කාලය තුළ ක්‍රියාවට නැංවීමට යෝජිතය. රට තුල ඕනෑම ස්ථානයක සිට මාධ්‍ය නාලිකාවක් පැහැදිලිව ශ්‍රවණය කිරීමේ අරමුණින් මෙම වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එෆ්.එම්. නාලිකා සංඛ්‍යාත සංශෝධනය කරන ලදුව රජයේ මාධ්‍ය නාලිකා වල ශ්‍රවන පරාසයද මේ වසරේදී වෙනස් විය.

## 2.15 අලෙවිය හා බෙදාහැරීම

රාජ්‍ය ආයතන කිහිපයක් වෙළඳාම ආශ්‍රිත කාර්යයන් හි නිරතව සිටී. ඒ අතර, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ දැරිය හැකි මිලකට සපයමින් වෙළඳපොල තරඟකාරීත්වය අවම මට්ටමක පවත්වාගෙන යාමට රුකුලක් වන ලක් සතොස සුවිශේෂී තැනක් ගනී. එසේම, දේශීය අත්කම් සඳහා පවතින වෙළඳපොල අවස්ථා සුරකිමින් හා එම නිෂ්පාදන සංචාරකයන් අතර ප්‍රචලිත කරමින් සිටින ලක්සල ද වැදගත් ස්ථානයක් ගනී. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණ වර්ධනය කර ගැනීමටත් ලාභදායිත්වය වැඩිකර ගැනීමටත් පාරිභෝගිකයාට මෙන්ම සුළු නිෂ්පාදකයාට සුභසාධනය සැලසීමටත් ශක්‍යතාවක් ඉහත ආයතන දෙකම සතුව පවතී. දේශීය නිපයුම් හා සැපයුම් දාමයන් මනා සම්බන්ධීකරණයක් ඇතිවීම තුලින් අගය එකතු කළ භාණ්ඩ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයකත්වය වර්ධනය වනු ඇති අතර එමගින් ආනයන සීමා කිරිමට හැකියාව ලැබෙනු ඇත.

ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ධීවරයන්ට අවශ්‍යය යටිතල පහසුකම්, වරාය පහසුකම් සැපයීම හා 4,000 කට අධික ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය වෙනත් සේවාවන් සැපයීම සිදු කරනු ලබන අතර ධීවර සංස්ථාව මාළු මිල දී ගැනීම හා බෙදා හැරිමේ කාර්ය තුළින් මිල ගණන් වල ස්ථායීතාව ඇති කිරීමේ කාර්ය සිදු කරනු ලබයි. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව පාසල් පෙළපොත් මුද්‍රණය කිරිම සිදු කරනු ලබන අතර පුද්ගලික අංශය සමග තරඟකාරීව කටයුතු කරමින් සියයට 25 ක වෙළඳපල කොටසක් අත්කරගෙන ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තියේ වැදගත් අංශයක් වශයෙන් කෘෂිකාර්මික අංශය සලකා බැලීමේදී ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම කුඩා පරිමාණ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය පොහොර සැපයීමේ හා බෙදාහැරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යයක් ඉටු කරයි. රටට වාර්ෂිකව ආනයනය කරනු ලබන පොහොරවල මුළු පිරිවැය රු. මිලියන 35,859 ක් වන අතර 2011 වර්ෂයේ පැවති නියඟය සහ රඳවා ගත් තොග හේතුවෙන් 2012 වර්ෂයේ දී ආනයනය කරනු ලැබූ මුළු පොහොර ප්‍රමාණය 2011 වර්ෂයේ ආනයනය කරනු ලැබූ මුළු ප්‍රමාණය වූ මෙ.ටොන් 801,000 ක ප්‍රමාණය මෙ.ටොන් 640,000 දක්වා අඩු වී ඇත. 2012 වර්ෂයේ මුළු පොහොර ආනයනයයෙන් සියයට 79 ක් හෙවත් මෙ.ටොන් 505,000 ක් ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් ආනයනය කොට ඇති අතර ඉතිරි මෙ.ටොන් 409,000 ක් පුද්ගලික අංශය විසින් ආනයනය කර ඇත. 2012 වර්ෂයේ දී රාජ්‍ය ආයතන දෙක විසින් ආනයනය කරනු ලැබූ පොහොර ප්‍රමාණය සියයට 29 ක් හෙවත් මෙ.ටොන්. 113,000 කින් වැඩි වී ඇති අතර පුද්ගලික අංශයේ ආනයනය සියයට 67 හෙවත් මෙ.ටොන් 135,000 කින් අඩු වී ඇත.

## 2.16 පුනර්ජනනීය නොවන සම්පත්

රාජ්‍ය ව්‍යාපාර සහ රජය සතු සම්පත් පෞද්ගලීකරණය නොකිරීමේ රජයේ පැහැදිලි ප්‍රතිපත්ති රාමුව තුළ පුනර්ජනනීය නොවන සම්පත් ආශ්‍රිත රාජ්‍ය ව්‍යවසායන්ද ක්‍රියාකාරීව තම මෙහෙයුම් කටයුතු වල නිරතව සිටී. යුධ ගැටුම් වලට මැදි වූ ප්‍රදේශ මුදවා ගැනීමත් සමගම එම ප්‍රදේශවල තිබූ ඛණිජ සම්පත්වල අගය එකතු කිරීම වර්ධනය කිරීම තුළින් ලෝක වෙළඳපොලේ දේශීය ඛණිජ සම්පත් සඳහා ඉල්ලුම වැඩිකර ගැනීමේ අරමුණ පෙරදැරි කරගනිමින් ක්‍රියාත්මක වන රජයට අයත් ඛණිජ ආශ්‍රිත ව්‍යාපාර ආයතන තුන විසින් තම ව්‍යාපාරික අරමුණුවලට අමතරව සමස්ථ ආර්ථික වර්ධනය කෙරෙහි උපායමාර්ගික භූමිකාවක් ඇතත් පොහොර ඛණිජ

සම්පත් ආශ්‍රිත නිෂ්පාදන වලින් ප්‍රමාණාත්මක නිෂ්පාදන මට්ටමක් කරා ලඟාවීමට මෙම ව්‍යාපාර ආයතන මෙතෙක් සමත් වී නොමැත.

## 2.17 රජය සතු ව්‍යාපාර වල ලාභදායීත්වය

රු.මි.

| | ආයතනය | ලාභ$අලාභ 2005 | 2011 | 2012 | ව්‍යාපාර පිරිවැටුම් 2012 | අයවැය සහාය-2012 පුනරාවර්තන | ප්‍රාග්ධන |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 3,120 | 16,485 | 19,794 | 110,138 | - | - |
| 2 | මහජන බැංකුව | 4,035 | 15,600 | 15,249 | 94,633 | - | - |
| 3 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 3,457 | 9,255 | 6,189 | 53,483 | - | - |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 415 | 689 | 436 | 3,012 | - | - |
| 5 | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | 162 | 321 | 73 | 2,689 | - | - |
| 6 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව * | - | 124 | 232 | 588 | - | - |
| 7 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 658 | 1,875 | 1,492 | 9,645 | - | - |
| 8 | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව * | - | 494 | 594 | 885 | - | - |
| 9 | සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | | 10,950 | 12,446 | 12,920 | - | - |
| 10 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,215 | 2,132 | 2,905 | 25,286 | - | - |
| 11 | ජාතික රක්ෂණ භාර අරමුදල | - | 2,315 | 2,107 | 2,262 | - | - |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | (6852) | (19,266) | (61,163) | 170,652 | - | - |
| 13 | ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | 9,839 | (94,508) | (89,658) | 515,704 | - | - |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 13,239 | 329 | 5,303 | 37,343 | - | - |
| 15 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | (22) | 421 | (579) | 16,294 | - | 29,590 |
| 16 | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රීලංකා) සමාගම | 670 | 3,421 | 4,826 | 11,431 | - | - |
| 17 | ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගම | 834 | (28,526) | (29,972 | 117,186 | - | 14,286 |
| 18 | මිහින් ලංකා සමාගම ** | | (1,967) | (2,866) | 7,452 | - | 507 |
| 19 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | (1,119) | (3,690) | (4,653) | 20,165 | 5,516 | 579 |
| 20 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | (42) | 211 | 247 | 8,407 | - | - |
| 21 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාරක සභාව | 45 | 427 | 471 | 9,604 | - | - |
| 22 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 21 | 43 | 73 | 3,570 | - | - |
| 23 | මිල්කෝ පුද්ගලික සමාගම | 85 | 111 | (215) | 5,430 | - | 37 |
| 24 | ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය | (12) | 250 | 28 | 1,219 | - | - |
| 25 | ලංකා ධීවර සංස්ථාව | (34) | (69) | (42) | 2,133 | - | - |
| 26 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | (66) | (302) | (277) | 442 | 109 | 96 |
| 27 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | 15 | 245 | 116 | 1,414 | - | - |
| 28 | ශ්‍රී ලංකා ආයුර්වේද නිෂ්පාදන සංස්ථාව | 6 | 63 | 54 | 415 | - | - |
| 29 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 431 | 418 | 468 | 20,215 | - | - |
| 30 | ශ්‍රී ජයවර්ධනපුර රෝහල | (185) | (28) | (121) | 1,855 | 843 | 71 |
| 31 | ස්වාධීන රූපවාහිනී ජාලය | 39 | 678 | 739 | 2,378 | - | - |
| 32 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 228 | 173 | 52 | 2,026 | - | 67 |
| 33 | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව | (98) | (78) | (54) | 1,051 | 134 | 65 |
| 34 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 48 | 144 | 102 | 2,849 | - | - |
| 35 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | 161 | 403 | 1,224 | - | - |
| 36 | රාජ්‍ය දැව සංස්ථාව | 408 | 603 | 828 | 3,562 | - | - |
| 37 | සීමාසහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | (112) | 62 | 105 | 2,379 | 400 | - |
| 38 | ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | (37) | 48 | (7) | 727 | - | - |
| 39 | සමූපකාර තොග වෙළඳ සංස්ථාව | (165) | 2 | 43 | 416 | - | - |
| 40 | ලංකා සතොස | (4) | 79 | 47 | 20,661 | - | - |
| 41 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 1"218 | 1"901 | 2"193 | 8"240 | - | - |
| 42 | ජාතික ලොතරැයි මණ්ඩලය | 269 | 396 | 566 | 12"212 | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 43 | ලංකා ඛණිජ වැලි සමාගම | 420 | 1"107 | 1"373 | 2"229 | - | - |
| 44 | ලංකා පොස්පේට් සමාගම | 39 | 202 | 113 | 449 | - | - |
| 45 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 21 | 134 | 141 | 1"235 | - | - |
| 46 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 86 | 113 | 163 | 287 | - | - |
| 47 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | (98) | (3"692) | (4"841) | 400 | 135 | - |
| 48 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | (84) | (52) | (119) | 575 | - | - |
| 49 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 20 | 225 | 186 | 550 | - | - |
| 50 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 55 | 97 | 86 | 473 | - | - |
| 51 | සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | 25 | 31 | 91 | 637 | - | - |
| 52 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | (135) | (258) | (252) | 926 | - | - |
| 53 | ශ්‍රී ලංකා කපු සංස්ථාව | (1)* | 20 | 44 | 150 | 59 | 28 |
| 54 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 1 | 50 | 73 | 511 | - | - |
| 55 | කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 4 | 54 | 58 | 157 | - | - |

*මූලාශ්‍රය: රජය සතු ව්‍යාපාර" රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

## 2.18 ප්‍රතිව්‍යුහගත වෙමින් පවතින ව්‍යාපාර

| ආයතනය | ප්‍රධාන කා¾යයන් | කාර්යසාධනය$ගැටළු | මුළු වියදම 2012 රු.මි | මුළු ආදායම 2012 රු.මි |
|---|---|---|---|---|
| ලංකා සළුසල සමාගම | වාණිජමය මෙහෙයුම් කටයුතු වල නිරත නොවේ' | සංචාරක කර්මාන්ත අංශය තුළ දේශීය හස්ත කර්මාන්ත ව්‍යාපාරයන්හි වෙළඳපොල සබඳතා ඇතිකරවීම ඉලක්ක කරමින් ප්‍රතිව්‍යුහගත කරන සැලසුම් සකස් කරමින් පවතී. | 217 | 194 |
| සමූපකාර තොග වෙළඳ සංස්ථාව | සතොස සහල් නිෂ්පාදන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, ගොවිපල අලෙවිසැල් ව්‍යාපෘතිය" සැපයුම් සේවා සහ ඇසුරුම් සේවා කටයුතු වල නියැලී සිටී' | ප්‍රමුඛ ව්‍යාපාරික කටයුතු ආදායම සියයට 41 කින් ඉහළ ගියද" මූලික වශයෙන් පොදුකාර්යය වියදම් ඉහළ යාම හේතුවෙන් සතොස ආයතනය 2012 වසරේදී ව්‍යාපාර අලාභය රු' මි' 246 ක් විය' 2016 වන විට සතොස විසින් පියවිය යුතු බැඳුම්කර වටිනාකම රු. බි' 4'4 ක් වේ' | 373 | 127 |
| රාජ්‍ය වාණිජ සමූපකාර තොග වෙළඳ සමාගම | වාණිජමය මෙහෙයුම් කටයුතුවල නිරත නොවේ. | රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භකර ඇත. | - | - |
| සීමාසහිත ජනතා පොහොර සමාගම | ඈවර කිරීමට යටත්ව ඇත . | 2012 ජූලි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජනතා පොහොර සමාගමේ" සමාගම සතු සියළුම ගබඩා සහ මූලස්ථාන ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට අනුමැතිය ලබා දී ඇති අතර ඈවර කිරිමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. | 253 | 30 |
| ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව. | වාණිජමය මෙහෙයුම් කටයුතුවල නිරත නොවේ. | කර්මාන්ත ශාලා 2 ක් පුද්ගලික ආයෝජකයෙකුට වසර 30 ක් සඳහා කල්බදු පදනම යටතේ පවරා ඇත. අනෙක් කර්මාන්තශාලාව කල්බදු පදනම යටතේ පවරාදීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් සුදුසු ආයෝජකයෙකු සෙවිමේ නිරතව සිටී. | - | - |
| ලංකා සෙරමික් සංස්ථාව | සෙවිලි උළු" බිම් අතුරන ටයිල් හා පිරිමැදූ ගඩොල් නිෂ්පාදනය | සන්නද්ධ හමුදා විසින් කර්මාන්තශාලා ඉඩකඩ රණවිරු සෑය ඉදිකිරිම් කටයුතු වලට අවශ්‍ය ගඩොල් නිපදවිමට යොදා ගැනීම හේතුවෙන් නිෂ්පාදනය ඉහළ ගොස් ඇති අතර 2012 දී රු. මි. 6 ක ලාභයක් වාර්තාකර ඇත. | 104 | 110 |
| සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත ආයතනය | ඈවර කිරීමට යටත්ව ඇත . | රාජ්‍ය සම්පත් හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ තිබූ හිඟුරාන සීනි කර්මාන්ත සමාගම පුනර්ජීවනය අරමුණු කරගෙන අළුතෙන් ස්ථාපනය කළ සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතට පැවරුණි. | 11 | 12 |
| සීමාසහිත කන්තලේ සීනි සමාගම | 1993 සිට මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඇති අතර වර්තමානයේදී ප්‍රතිව්‍යුහගතකරණය වෙමින් පවතී. | රාජ්‍ය සම්පත් හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ තිබූ කන්තලේ සීනි කර්මාන්ත සමාගම පුණර්ජීවනය අරමුණු කරගෙන අළුතෙන් ස්ථාපනය කළ සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතට පැවරුණි. | 15 | - |

| | | | | |
|---|---|---|---|---|
| ලංකා ෆැබ්රික් සමාගම | ඇවර කිරීමට යටත්ව ඇත . | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඇවරකරුවෙකු පත්කර ඇත. | - | - |
| බී.බී.සී. ලංකා සමාගම | පොල්තෙල් සහ සබන් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම | මුළු ආදායමින් සියයට 35 කුලී ආදායම් මත රඳා පවතී. ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බී.බී.සී. ලංකා සමාගම 2011 දී රු. මිලියන 8 ක ආදායමක් හා 2012 දී රු. මිලියන 32 ක ලාභයක් වාර්තා කර ඇත. 2012-2015 කාලය සඳහා කර්මාන්තශාලා නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. | 70 | 102 |
| මාන්තායි ලුණු සමාගම | සාමාන්‍ය ලුණු" ලුණු කුඩු සහ අයඩින් ලුණු නිෂ්පාදනය | අඩු අස්වැන්න හේතුකොට ගෙන වෙම්මනී ලුණු ලේවායේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඇත. වර්තමානයේ නිෂ්පාදනය කරන අමු ලුණු වලින් සියයට 60 ක් අඩු ලාභ ආන්තිකයක් යටතේ වැඩි ප්‍රමාණයකින් අලෙවි කරනු ලබයි. සමාගම තම නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම මගින් ඔවුන්ගේ වෙළඳපළ ශක්තිමත්කර ගත යුතුය. | 39 | 50 |
| සී නෝර් පදනම | ටෝලර් බෝට්ටු සහ වෙනත් ධීවර යාත්‍රා නිෂ්පාදනය, විකිණීම සහ ඒවාට අදාල අළුත්වැඩියා කටයුතු කිරිම. | 2012 වර්ෂය අවසාන වන විට ධීවර බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත වෙළඳපොළෙන් සියයට 30 ක් හා මාළු දැල් වෙළඳපොළින් සියයට 40 ක් අත්කරගෙන ඇත. 2012 වර්ෂයේදී මුළු ආදායම රු. මිලියන 206 දක්වා සියයට 36 කින් අඩු වී ඇති අතර 2011 වර්ෂයේ ලැබූ අලාභ 2012 දී රු. මිලියන 16 සිට  රු. මිලියන 7 දක්වා අඩුකරගෙන ඇත. | 213 | 206 |
| සීමාසහිත නෝර්ත් සී සමාගම | ධීවර ආම්පන්න නිෂ්පාදනය හා සැපයීම" ධීවරයින් සඳහා සහයක සේවා සැපයීම | වාර්ෂික මාළු දැල් නිෂ්පාදනය වෙළඳපොළ කොටසින් සියයට 10 ක් හෝ මෙට්‍රික් ටොන් 480 ක් පමණ වේ. 2012 වසරේදී ආදායම රු. මිලියන 172 ක් දක්වා වැඩි වූ අතර වියදම රු. මිලියන 255 දක්වා රු. මිලියන 50 කින් වැඩි විය. ඒ අනුව 2011 දී රු. මිලියනයක්ව පැවති අලාභය රු. මිලියන 83 දක්වා ඉහළ යාම සිදු වීමෙන් උග්‍ර ද්‍රවශීලතා ගැටළු පැන නැඟුනි. 2011 දී බැංකු වලට ගෙවිය යුතු ණය ප්‍රමාණය රු. මිලියන 3 සිට රු. මිලියන 20 දක්වා වැඩි වී තිබේ. | 255 | 172 |
| ලංකා ලේලන්ඩ් සමාගම | ලංකා අශෝක් ලේලන්ඩ් ආයතනයේ කොටස් වලින් සියයට 42 ක අයිතිය සතු කරගෙන ඇත. | ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම 1968 දී පූර්ණ රජය සතු වගකීම් සහිත සමාගමක් ලෙස ස්ථාපිත කරන ලදී. ලංකා ලේලන්ඩ් සමාගම 1983 දී අශෝක් ලේලන්ඩ් ලංකා සමාගම සමඟ ඒකාබද්ධ ගිවිසුමක් යටතේ ආරම්භ කළ බද්ධ ව්‍යාපාරය මත සමාගම මඟින් ශ්‍රී ලංකාව තුළ බස්, ට්‍රක්ස් සහ මෝටර් රථ වාහන උපාංග නිෂ්පාදනය හා එක්රැස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. අශෝක් ලේලන්ඩ් සමාගමේ කොටස් වලින් සියයට 42 ක් ලංකා ලේලන්ඩ් සමාගම සතුව පවතී. ලංකා ලේලන්ඩ් සමාගම සතු පනාගොඩ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි එහි ස්කන්ධ ප්‍රාග්ධනය සඳහා දායකත්වයක් දරයි. බද්ධ ව්‍යාපාරය මගින් ඉපයූ ලාභාංශ ආදායම රු. මිලියන 81 ක් වේ. ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම දැනට ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන නොයන බැවින් ව්‍යාපාර කටයුතු ඇවර කිරීම හෝ වසා දැමීමත් සමාගම සතු කොටස් මහා භාණ්ඩාගාරය වෙත පැවරීමත් වඩාත් සුදුසු වන අතර එමගින් සමාගම පවත්වා ගැනීම සඳහා පමණක් වන ලාභාංශ ආදායම් යොදා ගැනීම අනවශ්‍ය වේ. | 5 | 86 |

| | | | | |
|---|---|---|---|---|
| ලංකා සිමෙන්ති සමාගම | සිමෙන්ති ආනයනය කොට දේශීය වෙළඳපළ වෙත අලෙවි කිරීම සිදුකරයි. | ලංකා සිමෙන්ති සමාගම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සමඟ ඒකාබද්ධ කිරීමට ගෙන ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කන්කසන්තුරේ කර්මාන්ත ශාලාවේ සිමෙන්ති මලු ගත කිරීම නැවත ආරම්භ කර ඇත. | 120 | 79 |
| ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව | | | 86 | 340 |
| පරන්තන් කෙමිකල්ස් සමාගම | රසායන ද්‍රව්‍ය ආනයනය හා නැවත පිරවීම සිදු කරයි. | 2012 වසර තුලදී සමාගම විසින් ක්ලෝරින් මෙට්‍රික් ටොන් 2,025 ක් කෝස්ටික් සෝඩා මෙට්‍රික් ටොන් 88 ක් සහ හයිඩ්‍රොක්ලෝරික් ඇසිඩ් මෙට්‍රික් ටොන් 17 ක් අලෙවි කර ඇති අතර සමාගම ප්‍රධාන වශයෙන්ම සිදු කරන්නේ ක්ලෝරින් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය හා අලෙවි කිරීමයි. | 198 | 232 |
| ජාතික කඩදාසි සමාගම | කඩදාසි සහ සියළුම වර්ගයේ පල්ප සහ කඩදාසි ආශ්‍රිත නිෂ්පාදන" නිෂ්පාදනය හා විකිණීම. | ජාතික කඩදාසි සමාගම අලාභ ලබමින් වාලච්චේනෙයි කඩදාසි කම්හලේ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබයි. කෙසේ වුවද, ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ 2012 දී ආයතනය සඳහා නිසි බලධාරියෙකු පත්කරන ලද අතර 2012/13 කාලය තුල කර්මාන්ත ශාලාවේ යන්ත්‍ර සූත්‍ර උපරිම ධාරිතාවයට ක්‍රියාත්මක කරවීම පිණිස නවීකරණය කිරීම සඳහා රු. මිලියන 100 ක වියදමක් දරා ඇත. | 181 | 109 |
| ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම | බස් රථ බොඩි නිපදවීම හා අළුත්වැඩියාව | ප්‍රධාන වශයෙන්ම පුහුණු කාර්මික නිලධාරීන් නොමැතිවීම හා නවීන යන්ත්‍ර සූත්‍රවල හිඟකම හේතුවෙන් 2011 වර්ෂයේ අළුත්වැඩියා කල 71 ක් වූ බස්රථ ප්‍රමාණය 2012 දී 52 ක් දක්වා අඩු වූ අතර 2011/12 පැවති රු. මිලියන 29 ක් වූ ආදායම 2012/13 දී රු. මිලියන 23 ක් දක්වා අඩුවීමට ද බලපා ඇත.<br><br>සමාගම 2011/12 වර්ෂයන්ට සාපේක්ෂව 2012/13 දී රු. මිලියන 27 ක අලාභයක් වාර්තාකර ඇත. 2011/12 වසර වල සමාගම දිගින් දිගටම පාඩු ලැබීම හේතුවෙන් ලබාදී ඇති අයවැය සහනය රු. මිලියන 21 කි. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඉල්ලුමට සරිලන සේවයක් ලබාදීමේ ධාරිතාවයක් ලක්දිව ඉංජිණියරින් සමාගම සතුව නොපැවතීම හේතුවෙන්, ශ්‍රී ලංගම විසින්ම තම බස්රථ අළුත්වැඩියාව සිදු කරනු ලබයි. මේ අනුව රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුව ලක්දිව ඉංජිණියරින් සමාගමේ කාර්යයන් හා ශ්‍රී ලංගම කාර්යයන් ද්විකරණය වීම වැළැක්වීමට තාර්කික පියවරයන් ගතයුතුය. | 29 | 23 |

## 2.19 වාර්ෂික වාර්තා භාරදීම - රජය සතු වාණිජ ව්‍යාපාර

| | | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | √ | √ | √ | √ |
| 2 | මහජන බැංකුව | √ | √ | √ | √ |
| 3 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | √ | √ | √ | √ |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | √ | √ | √ | **X** |
| 5 | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | √ | √ | √ | √ |
| 6 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව * | √ | √ | √ | √ |
| 7 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | √ | √ | √ | √ |
| 8 | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව * | √ | √ | √ | √ |
| 9 | සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | √ | √ | √ | **X** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | √ | √ | √ | √ |
| 11 | ජාතික රක්ෂණ භාර අරමුදල * | √ | √ | X | X |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | √ | √ | X | X |
| 13 | ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | X | X | X | X |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | √ | √ | X | X |
| 15 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | √ | √ | X | X |
| 16 | ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රීලංකා) සමාගම | √ | √ | √ | √ |
| 17 | ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගම | √ | √ | X | - |
| 18 | මිහින් ලංකා සමාගම ** | √ | X | X | - |
| 19 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | X | X | X | X |
| 20 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | √ | √ | X | X |
| 21 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාරක සභාව | √ | √ | X | X |
| 22 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | √ | X | X | X |
| 23 | මිල්කෝ පුද්ගලික සමාගම | √ | √ | X | - |
| 24 | ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය | √ | √ | √ | X |
| 25 | ලංකා ධීවර සංස්ථාව | √ | X | X | X |
| 26 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | √ | X | X | X |
| 27 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | √ | √ | √ | X |
| 28 | ශ්‍රී ලංකා ආයුර්වේද නිෂ්පාදන සංස්ථාව | √ | √ | √ | X |
| 29 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | √ | √ | √ | X |
| 30 | ශ්‍රී ජයවර්ධනපුර රෝහල | √ | √ | X | X |
| 31 | ස්වාධීන රූපවාහිනී ජාලය | √ | √ | √ | X |
| 32 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | √ | √ | X | X |
| 33 | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව | √ | √ | √ | X |
| 34 | සීමාසහිත ලංකා පොහොර සමාගම | √ | √ | √ | - |
| 35 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | √ | √ | √ | - |
| 36 | රාජ්‍ය දැව සංස්ථාව | √ | √ | √ | X |
| 37 | සීමාසහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | √ | √ | X | X |
| 38 | ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | X | X | X | X |
| 39 | සමූපකාර තොග වෙළඳ සංස්ථාව | √ | X | X | X |
| 40 | ලංකා සතොස | X | X | X | X |
| 41 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | √ | √ | √ | X |
| 42 | ජාතික ලොතරැයි මණ්ඩලය | √ | √ | √ | X |
| 43 | ලංකා ඛණිජ වැලි සමාගම | √ | √ | √ | √ |
| 44 | ලංකා පොස්පේට් සමාගම | √ | √ | √ | X |
| 45 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | √ | √ | √ | X |
| 46 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | √ | X | X | X |
| 47 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | √ | X | X | X |
| 48 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | X | X | X | X |
| 49 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | √ | √ | √ | √ |
| 50 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | X | X | X | X |
| 51 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | √ | √ | √ | √ |
| 52 | සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | √ | √ | √ | - |
| 53 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | √ | X | X | X |
| 54 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | √ | √ | √ | X |
| 55 | කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | √ | √ | √ | - |

## 3. මානව සම්පත් කළමණාකරණය

2012 වර්ෂය තුලදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මාණ්ඩලික නිලධාරීන් 21 ක් ඇතුලත්ව සමස්ථ කාර්ය මණ්ඩලය 63 දෙනෙකුගෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා වගකීම් ඉටු කරනු ලැබීය.

### 3.1 මාණ්ඩලික නිලධාරීන්ගේ තොරතුරු - 2012

| | |
|---|---|
| ඩී.එම්.ඒ. හරස්ගම මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| ඒ.කේ. සෙනෙවිරත්න මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| ටී.වී. වීරසේන මහතා | අධ්‍යක්ෂ |
| ආර්.එම්.ඒ. රත්නායක මහතා | අධ්‍යක්ෂ |
| පී.ඒ.එස්. අතුල කුමාර මහතා | අධ්‍යක්ෂ අධ්‍යක්ෂ |
| විශාකා අමරසේකර මෙනෙවිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ඒ. බටගොඩ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ඩබ්.ජී. චන්ද්‍රිකා මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ආර්.එම්. විජේසිංහ බණ්ඩා මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ජේ.පී.පී. ලියනගේ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| කේ.වි.සී. දිල්රුක්ෂි මිය | සහකාර අධ්‍යක්ෂ |
| එස්.කේ.එම්.කේ. ද අල්විස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| එල්.පී.එස්. දුෂ්‍යන්ති | සහකාර අධ්‍යක්ෂ |
| එස්.එම්. රාජපක්ෂ මිය | සහකාර අධ්‍යක්ෂ |
| ආර්.ඒ.එල්.යූ. කුමාර මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ජී.එම්.අයි.යූ. බණ්ඩර මහතා | සහකාර අධ්‍යක්ෂ |
| කේ.එස්.පී. රූපසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ඩී.ජී.එන්. කුමාරි මිය | සහකාර අධ්‍යක්ෂ |
| කේ.එස්.එම්. ද අල්විස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| ඩබ්.කේ.ඩී. ඩන්ස්ටන් මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| ඒ.ආර්. වික්‍රමසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| කේ. මැණිකේ මිය | පරිපාලන නිලධාරි |

කාර්ය මණ්ඩලයේ බහුතරය ව්‍යාපාර කළමනාකරණය, ගණකාධිකරණය, ආර්ථික විද්‍යාව, අලෙවිකරණය, රාජ්‍ය කළමනාකරණය වැනි උපාධිධාරීන් වන අතර" කිහිපදෙනෙක් විවිධ ක්ෂේත්‍රවල ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි හදාරා ඇත. නිලධාරීන්ගෙන් හතර දෙනෙකු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකත්වය දරණ ගණකාධිකාරීවරුන් වන අතර අනෙක් බොහෝ දෙනා අවසාන අදියරේ විභාග සඳහා ඉදිරිපත් වී ඇත..

### 3.2 2012 වර්ෂයේදී ස්ථානමාරුවීම් ලද මාණ්ඩලික නිළධාරීන්

| | |
|---|---|
| එස්.ආර්. ආටිගල මහතා | අධ්‍යක්ෂ ජනරාල් |
| ඩී. සේනානායක මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| වි.එම්. අමීන් මහතා | අධ්‍යක්ෂ |
| අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ |
| යූ. විජිත පෙරේරා මහතා | සහකාර අධ්‍යක්ෂ |
| ඩී.පී. පෙරේරා මහතා | පරිපාලන නිලධාරි |

## 3.3 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ස්ථානමාරුවීම්

| තනතුර | සේවක සංඛ්‍යාව | |
|---|---|---|
| | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු ලැබූ |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| අධ්‍යක්ෂ | 01 | 03 |
| සහකාර අධ්‍යක්ෂ | 03 | - |
| පරිපාලන නිලධාරි | -01 | 01 |
| සංවර්ධන නිලධාරි | -- | - |
| පර්යේෂණ සහකාර | -- | 01 |
| කළමනාකරණ සහකාර | 07 | 07 |
| රියදුරු | 06 | 07 |
| කා.සේ.සේ | 05 | 02 |

## 3.4 සේවක සංඛ්‍යාව - 2012

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | 01 | 01 | - |
| අධ්‍යක්ෂ | 06 | 03 | 03 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 13 | 16 | - | 03 |
| සංවර්ධන නිලධාරි | 11 | 04 | 02 | - |
| මූල්‍ය විශ්ලේෂක | 03 | 03 | - | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | 07 | - |
| කළමනාකරණ සහකාර | 21 | 16 | 05 | - |
| පිළිගැනීමේ නිලධාරි | 01 | 01 | - | - |
| දත්ත සැකසුම් ක්‍රියාකරු | 02 | - | 02 | - |
| රියදුරු | 08 | 07 | 01 | - |
| කා.සේ.සේ | 06 | 10 | - | 04 |
| **එකතුව** | **75** | **63** | **19** | **07** |

## 3.5 කාර්ය මණ්ඩල පුහුණුවීම් (සමුළු/පාඨමාලා/වැඩමුළු) - 2012

| | පුහුණුවේ නම | සහභාගි වූ සංඛ්‍යාව | කාල සීමාව |
|---|---|---|---|
| දේශිය | පර්යේෂණ ක්‍රමවේද හා දත්ත විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව | 04 ස.අ/නි.අ/මු.වි | දින 02 |
| | සිගාස් | 02 ස.අ/ක.ස | දින 06 |
| | මහජන උපයෝගිතා මිලකරණ ප්‍රතිපත්ති, ගැටළු හා යහපුරුදු | 04 නි.අ /ක.ස | දින 01 |
| | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු පාඨමාලාව | 01 ක.ස | දින 01 |
| | මූලික පරිගණක පුහුණු පාඨමාලාව | 01 ක.ස | දින 05 |
| | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලන ඩිප්ලෝමාව | 01 අති.අ.ජ. | මාස 03 |
| | ඵලදායි විගණනය සම්බන්ධ ජාත්‍යන්තර සමුළුව | 02 නි.අ./ස.අ | දින 01 |
| | රාජ්‍ය ආයතන වල ආදායම් රැස් කිරීමේදී හා ගෙවීම් කිරීමේදී අදාල වන බදු සම්බන්ධ පුහුණුව | 01 ක.ස | දින 01 |
| | ප්‍රායෝගික පුහුණුව | 07 රියදුරු | දින 04 |
| | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පාඨමාලාව | 01 අ. | දින 01 |
| | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ වැඩමුළුව | 01 අ. | දින 03 |
| | සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 01 සං.ස | අවුරුදු 01 |
| විදේශ | රක්ෂණ නියාමණ අධීක්ෂණ වැඩසටහන - මෝල්ටා | 01 ස.අ | දින 05 |
| | රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා දින වැඩමුළුව 2012 කාර්යක්ෂම රාජ්‍ය, පෞද්ගලික සහයෝගීතා පිළිබඳ ආයතන සංවර්ධනය - ස්විට්සර්ලන්තය | 01 ස.අ | දින 04 |
| | රාජ්‍ය සේවා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව - චීනය | 01 නි.අ | දින 05 |
| | මූල්‍ය ස්ථාවරත්වය සඳහා ආර්ථික ප්‍රතිපත්ති - සිංගප්පූරුව | 01 නි.අ | දින 12 |

මූලාශ්‍රය : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# 4. මූල්‍ය කළමනාකරණය

## 4.1 2011 සහ 2012 වර්ෂ සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම

| | තථ්‍ය වියදම | | ශුද්ධ ප්‍රතිපාදන | අයවැයගත ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | 2011 | 2012 | 2011 | 2012 |
| **පුනරාවර්තන** | | | | |
| පුද්ගල පඩිනඩි | 25,335 | 26,343 | 26,400 | 26,490 |
| වෙනත් පුනරාවර්තන | 15,519 | 17,862 | 16,364 | 21,885 |
| **එකතුව** | **40,854** | **44,205** | **42,764** | **48,375** |
| **ප්‍රාග්ධන** | | | | |
| **පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | |
| 2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | 0 | - | 1,500 |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 347 | - | 500 | - |
| **අත්පත්කර ගැනීම්** | | | | |
| 2102 ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 86 | 1,942 | 100 | 2,100 |
| **හැකියා වර්ධනය** | | | | |
| 2401 පුහුණු සහ හැකියා වර්ධනය | 851 | 389 | 900 | 1,000 |
| **එකතුව** | **1,284** | **2,331** | **1,500** | **4,600** |

මූලාශ්‍රය : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

## 4.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම - 2012

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සීමා හා තථ්‍ය අගය**

| | අනුමත සීමා | වර්ෂ අවසාන තථ්‍ය අගය |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 4,000,000.00 | 1,913,495.00 |
| අවම ලැබීම් සීමාව | 1,500,000.00 | 1,965,026.68 |
| උපරිම හර ශේෂය | 18,000,000.00 | 11,525,529.63 |

මූලාශ්‍රය : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

2012 වර්ෂය සඳහා වාර්ෂික විසර්ජන ගිණුම සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති විසින් විගණනය කර ඇත.